මව්රට
ලිපිනය නො: 22, ජයරත්න මාවත, කොළඹ 05
කර්තෘ මණ්ඩලය 0112505134
ඊමේල් news@mawratanews.lk
වෙබ් අඩවිය www.mawratanews.lk
බෙදාහැරීම් 0764 449 688
දැන්වීම් 0114870063

උපුල් ජෝශප් ප්‍රනාන්දුගේ

## ගුරුදු විග්‍රහය

# සජිත් පණ මද්ද?



**'අපේ විපක්ෂ නායකතුමා හරියට කාක බෝධිය වගේ. වඳින නිසා කපන්නත් බැහැ. කාක්කෝ ලගින නිසා නොකපත් බැහැ...'**

මේ කතාව ජේ.ආර්.පී. සූරියප්පෙරුම කීවේ වෙන කාටවත් නොවේ. විපක්ෂ නායක ජේ.ආර්. ජයවර්ධනටය. 70-77 සමගි පෙරමුණු ආණ්ඩු කාලේ විපක්ෂ නායක ධුරය දැරුවේ ජේ.ආර්.ය. ජේ.ආර්. ආණ්ඩුවට දැනෙන්න කිසිවක් නොකරනවා යැයි චෝදනා කළේ සේනානායකවරුන්ගේ ඔටුන්න හිමි කුමාරයා රුක්මන් සේනානායකව විපක්ෂ නායක කරන්න වලි කාපු ජිනදාස නියතපාල, ජේ.ආර්.පී. සූරියප්පෙරුම වැනි එකල තරුණ නායකයන්ය.

70-77 බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව පාලන කාලය වසර දෙකකින් දීර්ඝ කරගන්න යන විට ජේ.ආර්. ඊට එරෙහිව සියලු යූ.ඇන්.පී. මන්ත්‍රීවරුන්ට ආසනවලින් ඉවත් වී අතුරු මැතිවරණවලට තරග කොට පාර්ලිමේන්තුවට යමු යැයි යෝජනා කළේය. සමහර මන්ත්‍රීවරුන් කැමැති නොවීය. අවසානයේ ජේ.ආර්. තනිවම ඉවත්වී අතුරු මැතිවරණයකින් පාර්ලිමේන්තුවට තේරී පත්විය. ඒත් පාලන කාලය වසර දෙකකින් දීර්ඝ කිරීමේ බණ්ඩාරනායක මැතිනියගේ උත්සාහය නතර කරගන්න ජේ.ආර්.ට බැරි විය. මේ, ජේ.ආර්. ජයවර්ධන චරිතාපදානය ඒ ගැන කියන කතාවය.

'යටත් පිරිසෙයින් තාවකාලිකව හෝ කරබාගෙන සිටීමට ඔහු තීරණය කළේය. ඔහුගේ එම පරාජිත ස්වභාවය දැක පක්ෂය තුළ සිටි ඔහුගේ විවේචකයෝ එඩිතර වූහ. 'මිනිසුන් දහසක් පිරිවරා සිටි යෝර්කයෝ මහා වංශක්කාර ආදිපාදවරයා කන්ද මුදුනට ඔවුන් මෙහෙයවීමෙන් අනතුරුව ආපසු කඳු පාමුලට ඔවුන් මෙහෙයවීය...'

ජේ.ආර්. මේවා ඔක්කොම ඉවසාගෙන සිටියේය. අවසානයේ ඔහු අගමැති වී ලංකාවේ පළමු විධායක ජනාධිපති විය. ජේ.ආර්.ට පණ මදි කී රුක්මන් සේනානායකලා ආණ්ඩුවට යටින් උදව් කළහ.

ජේ.ආර්. බලයට ආ විට විපක්ෂ නායක වූ අනුරටත් මේ චෝදනාවම එල්ල විය.

'අනුර ආණ්ඩුව එක්ක ඩීල් දමලා ජේ.ආර්. තමයි අනුරව විපක්ෂ නායක කළේ...'

අනුරට එහෙම චෝදනා කළේ අනුරගේ මස්සිනා විජය සහ අක්කා චන්ද්‍රිකාත්, ශ්‍රීලනිපයේ ජ්‍යෙෂ්ඨ නායකයනුත්, වාමාංශික නායකයනුත්ය. අවසානයේ 1988 ජනාධිපතිවරණයට යූ.ඇන්.පී. අපේක්ෂක ප්‍රේමදාස සමග මරාගෙන මැරෙන සටනක් කළේ මැතිනිය සහ අනුරය. ආණ්ඩුව එක්ක ඩීල් දමලා කියා අනුරට චෝදනා කළ විජයගේ ගෝලයන් වූ ඔසී අබේගුණසේකරලා කොමියුනිස්ට් පක්ෂය, ලංකා සමසමාජ පක්ෂය මැතිනියගේ ඡන්ද කඩා ප්‍රේමදාසව දිනවන්න තුන්වැනි අපේක්ෂකයෙක් දමනු ලැබීය. ඒ ඔසීය.

1989 මහ මැතිවරණයෙන් පසු විපක්ෂ නායිකාව වූ බණ්ඩාරනායක මැතිනිය ප්‍රේමදාස ආණ්ඩුව එක්ක හැප්පෙන්නේ නැහැ කියා විපක්ෂ නායක ධුරය අහිමි වුණු අනුර ඇතුළු අනුරගේ තරුණ මන්ත්‍රීවරු චෝදනා කළහ. අවසානයේ ප්‍රේමදාසට එරෙහිව දෝෂාභියෝගය ගෙන ආවේ මැතිනියය. මැතිනිය පණ මදි කියපු අනුර ඇතුළු තරුණ මන්ත්‍රීවරු නතර වුණේ යූ.ඇන්.පී.යට

## ජේ.ආර්.ගේ ඉඳන් විපක්ෂනායකට ගැහීම

එකතු වෙලාය.

1994 විපක්ෂ නායක වූ රනිල්ටත් පණ මදි චෝදනාව ගෙන ආවේ පක්ෂයේ ගාමිණීවාදීන්ය. චන්ද්‍රිකාගේ ආණ්ඩුව යූ.ඇන්.පී. ආණ්ඩු කාලයේ හොරු අල්ලන්න අල්ලස් කොමිෂන් දමා යූ.ඇන්.පී.යේ ප්‍රබලතම ජ්‍යෙෂ්ඨ නායකයකු වූ විජයපාල මෙන්ඩිස්ට එරෙහිව දූෂණ චෝදනා ගොනුකළ විට රනිල් තමාගේ නායකත්වය යටතේ යූ.ඇන්.පී.ය පිරිසුදු යැයි පෙන්වන්න විජයපාලගේ කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකත්වය තහනම් කළේය. රනිල් ආණ්ඩුවට ඕනෑ දේ කරනවා යැයි පක්ෂයේ ජ්‍යෙෂ්ඨයන් කීවත් රනිල් විජයපාලව යූ.ඇන්.පී.යෙන් පන්නා දැමුවේ යූ.ඇන්.පී.ය ක්ලීන් පක්ෂයක් කියා පෙන්වන්නටය. 2002 රනිල් චන්ද්‍රිකාගේ ආණ්ඩුව පෙරළා අගමැති විය. රනිල් පණ මදි කී යූ.ඇන්.පී. ජ්‍යෙෂ්ඨයෝ චන්ද්‍රිකාට එක්වූහ.

රනිල් අගමැති වූ විට විපක්ෂ නායක වූ මහින්දටත් ශ්‍රීලනිපයේ චන්ද්‍රිකාවාදීන් සහ එවක ශ්‍රීලනිපය සමග සන්ධාන ගහන්න සාකච්ඡා කළ ජවිපෙ මහින්දට රනිල් එක්ක ඩීල් එකක් ඇති බවත්, මහින්ද විපක්ෂ නායක රෝල් එක හරියට කරන්නේ නැති බවත් කියමින් චෝදනා කළේය. මහින්දව විපක්ෂ නායක කළේ රනිල් නිසා මහින්ද පාර්ලිමේන්තුවේ රනිල්ගේ කොන්ත්‍රාත් කරනවා යැයි චන්ද්‍රිකාවාදීහු සහ ජවිපෙ ප්‍රසිද්ධියේ කීහ. ඒත් අන්තිමේ මහින්ද, රනිල් පරාජය කොට අගමැති වී ජනාධිපති විය.

'එදා ජේ.ආර්.ට, අනුරට, මැතිනියට, රනිල්ට, මහින්දට කී කතාවම සජිත්ටත් කියනවා නේද...?'

2020 සජිත් විපක්ෂ නායක වූ විට සජිත් පණ මදි කියන කතාව පටන් ගත්තේ විපක්ෂ නායකකම තමන්ට අහිමි වීමේ වේදනාවෙන් සිටි රනිල් සහ එකල රනිල්ගේ සගයන් වූ අනුර ඇතුළු ජවිපෙ නායකයන්ය.

'සජිත්ට ගෝඨා එක්ක ඩීල් එකක් තියෙනවා...'

එදා රනිල්වාදීන් සහ අනුරලා කීවේ එහෙමය. හැබැයි අරගලයට කලින් 'ගෝඨා ගෝ හෝම්' කියන්න ජනාධිපති මන්දිරයට මහජන ගංගාවක් එක්ක ගියේ සජිත්ය. ගෝඨා, සජිත්ට අගමැතිකම භාරගන්න කී විට අගමැතිකම භාරගන්න නම් මාස 6ක අන්තර්කාලීන ආණ්ඩුවක් පිහිටුවා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කර ගෝඨා ගෙදර යායුතු යැයි කොන්දේසි ඉදිරිපත් කළේ සජිත්ය. සජිත් එසේ කොන්දේසි ඉදිරිපත් කරද්දී කිසිදු කොන්දේසියකින් තොරව පස්සෙ දොරෙන් ගිහින් ගෝඨාගෙන් අගමැතිකම භාරගත්තේ සජිත්-ගෝඨා ඩීල් එකක් තියෙනවා කී රනිල්ය.

> **'අනුරව දිනවලා සජිත් පණ මදි කියන්නේ 2024 අනුරව පරද්දන්න සජිත්ව දිනවන්න තිබුණානේ...?'**
> **සජිත්වාදීන් අද අහන්නේ ඔය ප්‍රශ්නයය. අද සජිත් පණ මදි කියලා ලොකුවට කියන්නේ අනුරව දිනවන්න ජනාධිපතිවරණයට ආ රනිල්ය.**

එදා රාජපක්ෂ පවුල රනිල්ව අගමැති කොට ජනාධිපති කළේ නාමල්ව ඊළඟ නායකයා කරන්න බාධාව වූ සජිත්ව ඉවර කරන්නටය. රනිල් ජනාධිපති වී 2024 ජනාධිපතිවරණයට ආවේ අනුරව දිනවා සජිත් ඉවර කරන්නටය. අද සජිත්ට පණ මදි කියන්නේ එදා අනුරව දිනවන්න වැඩ කළ රනිල්වාදීන්ය.

'ඊළඟ ජනාධිපතිවරණය වමයි දකුණයි අතර සටනක්...'

'ඒ සටනට නායකත්වය දෙන්නේ රනිල් සහ අනුර...'

'ඊළඟ ජනාධිපතිවරණයේදී සජිත් කෙනෙක් හොයාගන්නවත් නැති වෙයි...'

'රනිල් සජිත්ව කුඩුපට්ටම් කරලා සමගි ජන බලවේගය යූ.ඇන්.පී.යට බද්ධ කරයි...'

රනිල් ජනාධිපති වූ අලුත රනිල්වාදීන් සහ අනුරවාදීන් විග්‍රහ, විශ්ලේෂණ කළේ ඔහොමය.

අන්තිමේදී සටන පැවැතියේ අනුර සහ සජිත් අතරය. රනිල් මැද්දට පැනලා අනුරව දිනෙව්වේ සජිත්ව ඉවර කරන්නටය.

'අනුරව දිනවලා සජිත් පණ මදි කියන්නේ 2024 අනුරව පරද්දන්න සජිත්ව දිනවන්න තිබුණානේ...?'

සජිත්වාදීන් අද අහන්නේ ඔය ප්‍රශ්නයය. අද සජිත් පණ මදි කියලා ලොකුවට කියන්නේ අනුරව දිනවන්න ජනාධිපතිවරණයට ආ රනිල්ය. ඊළඟට අරගලය වෙලාවේ සජිත් අගමැති වීම වළක්වන්න රනිල්ට සහාය පළකළ අභියෝගය භාරගත්තා යැයි කී ශ්‍රීලනිපයය. රනිල් පරදින බව දැන දැන 2024 ජනාධිපතිවරණයේ සජිත් පරද්දන්න රනිල්ට වැඩ කළේ ඔවුන්ය.

එදා රාජපක්ෂවරු රනිල්ව වැඩ බලන ජනාධිපති ලෙස පත් කළ වෙලාවේ රනිල් අගමැති ධුරයෙන් ඉවත් කොට සියලු පක්ෂවලට පිළිගත හැකි අගමැතිවරයෙක් පත්කොට සර්ව පාක්ෂික ආණ්ඩුවක් හදමු කියා මේ ශ්‍රීලනිප ඇමැතිවරු සිය ඇමැති ධුරවලින් ඉවත් වූවා නම් අද අනුර ජනාධිපති පුටුවේ නැත.

ඊළඟට සජිත් ආවොත් නාමල්ට චාන්ස් එකක් නැති වෙයි කියලා ගණන් හදලා රනිල්ව ජනාධිපති කළ රාජපක්ෂ පවුලය.

ලංකාවේ ජනාධිපති වෙන්න වගේම විපක්ෂ නායක

## ගහපු අය අන්තිමට ගියපු තැන

වෙන්නත් වාසනාව තියෙන්න ඕනාය. ජනාධිපති වෙන්නේ 50%ක ඡන්ද ප්‍රතිශතයක් ගෙනය. විපක්ෂ නායක වෙන්නේ පාර්ලිමේන්තුවේ වැඩිම ආසන හිමි විපක්ෂයේ නායකයාය. විපක්ෂයට නායකත්වය දෙන්න ජනතාව තෝරාගෙන තියෙන්නේ ඒ නායකයාවය. ඒ නායකයාව දිරවන්නේ නැතිව විපක්ෂ නායකයා පණ මදියි කිය කියා යාමෙන් ආණ්ඩුව දුර්වල වෙන්නේ නැත. ආණ්ඩුව තව තවත් ශක්තිමත් වේ. අවසානයේ ආණ්ඩුව අර්බුදයකට ගිය විට ආණ්ඩුව බේරාගන්න ඉස්සෙල්ලාම දුවන්නේ විපක්ෂ නායක පණ මදි කී කට්ටියමය.

උපුල් ජෝශප් ප්‍රනාන්දු

---




# කුජ දෝෂය නැති කරගෙන සාර්ථක විවාහයක් ගත කරන්නේ මෙහෙමයි

**අප වෙත එවූ කේන්ද්‍ර පරීක්ෂාව ඇසුරෙන් 'මිස් මගේ විවාහය තාම උනේ නෑ. මිස් මගේ විවාහය පරක්කු ඇයි? මගේ කේන්ද්‍රරේ කුජ - ශනි 7 ඉන්නවා. මට විවාහයක් වෙන්නේ කවදද? කරන්න කියපු වත්පිළිවෙත් නම් කළා. ඒත් තාම මට විවාහයක් සිද්ධ උනේ නෑ. ඒ වෙනුවෙන් තවත් කරන්න දේවල් තියෙනවද? මිස් මගේ කේන්ද්‍රරේ විවාහ දෝෂ තියෙනවා. මට විවාහයක් සිද්ධ වෙනවද? නැද්ද?' මේ විදියේ ප්‍රශ්න ගැටලු තියෙන (කේන්ද්‍ර පරීක්ෂාවකට යොමුකළ පසුව) නිවැරැදි දැනුවත් කිරීම් ගණනාවක් අප වෙත යොමුවූ බැවින් එවැනි වූ ගැටලුවලට විසඳුම්, පිළියම් සොයන ඔබට මේ ලිපිය වැදගත් වේවි කියා ඔබගේ දැනුවත් වීමටත්, අනිසි බියක් ඇතිකර නොගැනීමටත් මෙම ලිපි පෙළ ඔබට වැදගත් වනු ඇත.**

ඔබගේ උත්පත්ති කේන්ද්‍ර සටහනේ කුජ ග්‍රහයා 1-2-4-7-8-12 යන ස්ථානයක තැන්පත් වී සිටින්නේ නම් එය ජ්‍යොතිෂයට අනුව කුජ දෝෂය, විවාහ දෝෂය, භෞම දෝෂය ලෙස හැඳින්වෙන බව ඔබ මේ වනවිටත් හොඳින්ම දැනුවත්වී ඇති කියා මම හිතනවා. ඒ වගේම කුජ ග්‍රහයා සමග ශනි ග්‍රහයා මෙකී ස්ථානවල තැන්පත්වීමත් විවාහ දෝෂයක් ලෙස ජ්‍යොතිෂයේ සඳහන් වෙනවා. එවිට එම දෝෂ තත්ත්වයන් විවාහ දෝෂ, ශනි මංගල දෝෂ, භෞම දෝෂ ආදී විවාහ දෝෂ මෙන්ම විවාහ ඵල අඩුවීම, යුගදිවි බාධා, කල් පවතින ලෙඩ රෝග මෙන්ම ලෞකික ආශාවන් තරමක් දුරට බැහැර වූ අයකු ලෙස කටයුතු කිරීමටත් බොහෝ විට පෙනීයන කාරණාවක් වනු ඇත.

මෙවැනි කේන්ද්‍ර සටහන් හිමි ජන්මියා තුළ අන් අයට සාපේක්ෂව ගත් කල ඉතා ප්‍රබල ආත්ම විශ්වාසයක්, ඒ වගේම තරහ යෑමක්, කලහකාරී බවක්, මෙන්ම සෞම්‍ය ගතිය තරමක් දුරට අඩු බවක් පෙනීමත් ඉතා සුවිශේෂ වන්නේය. ඒකට හේතුව කුජ ග්‍රහයා ග්‍රහ ලොවේ සෙන්පතියා මෙන්ම එඩිතර ග්‍රහයා වන නිසාය. ඒ අනුව ගත් කල ලග්නයේ කුජ සිටී නම් දැඩි තීරණ ගැනීම, ඉක්මන් කෝපය, මුරණ්ඩු කඩිසර අයකු වීමද,

2 වැන්නේ කුජ සිටි විට, වචනවල අසංවර බව, කියන දේ කෙළින්ම කියන, වේගවත් වචන හසුරුවන අතර, පවුල තුළ නිතර අඬදබර වන වචන පිටවීමද,

4 වැන්නේ කුජ සිටි විට, ගෘහ ජීවිතය තුළ සතුට සාමය අඩු වීම, පවුලේ අය සමග ගැටුම් මතභේද ඇතිවීම, මානසික සුවය අඩුවන අවස්ථා වැඩි වීමද,

7 වැන්නේ කුජ සිටි විට, තම සහකරු හෝ සහකාරිය සමග නිතර ආරවුල් අඬදබර ඇති වීමට ඉඩ යෙදීම, දෙදෙනාගේ අදහස් අනුව මත ගැටුම් දුරදිග යෑම (නීති කටයුතු දක්වා ගෙනයෑම), විවාහයේදී ඉවසීම, දුරදිග බලා කටයුතු කිරීම අඩුවෙන් සිදුවීම නිසා නීතිමය පියවර දක්වා දුරදිග යෑම වැනි දේ සිදුවීම, දෙදෙනාගේ ආකර්ෂණය අඩුවීම, එකිනෙකාව රුස්සන්නේ නැති ස්වභාවයක් මතුවීම,

8 වැන්නේ කුජ සිටි විට, සහකරුගේ ආයුෂ ගැටලු ඇතිවීම, විවාහයෙන් පසු කායික දුබලතා මතුවීම, රුධිර සංසරණ අක්‍රමිකතා ඇතිවීම, විවාහ සතුට හීන වීමට කටයුතු යෙදීමද,

12 වැන්නේ කුජ සිටි විට, විවාහ සැපය යුගදිවි සතුට හීන වී යෑම, අනවශ්‍ය වියදම් සඳහා වැයවීම, හිතුමනාපයට නිතර කටයුතු කිරීම, විවාහය පිළිබඳ කලකිරුණු අත්විඳීම්වලට මුහුණ පෑමට සිදුවීම ආදියද ජන්මියාට මුහුණ පෑමට සිදුවන බව ජ්‍යොතිෂය ඇසුරෙන් හෙළිදරව් වේ. එයට හේතුව ලෙස සැලකිය හැක්කේ මෙම කුජ දෝෂ තත්ත්වයන් ඇති ජන්මියා තරමක් රළු ආවේගශීලී ඇවතුම් පැවතුම් ඇති නිසාවෙන්ද, තමාටම අවශ්‍ය වන පරිදි කටයුතු වෙන්න ඕනේ කියන ඒකාධිපති පාලන මතය නිසාද, තම සහකරු හෝ සහකාරිය පිළිබඳ නිවැරැදි අවබෝධයක් ඉවසීමක් ඇති නොකර ගැනීම තුළින් විවාහ දිවියේ අසාර්ථකත්වය උසාවිය දක්වා ගෙන යෑමට තරම් කරුණු කාරණා දුරදිග යෑමට පවා ඉඩකඩ යෙදීම මෙයට හේතුව ලෙස ජ්‍යොතිෂ ඇසට අනුව පෙනීයන ප්‍රබල කාරණාවී ඇති බව මේ වනවිට කේන්ද්‍ර පරීක්ෂාවන්හි යෙදුණු අත්දැකීම් අනුව ඉතා පැහැදිලි වූ කරුණු කාරණා වන්නේය. මෙකී තත්ත්වයන් වෙනස් වන අවස්ථාද ජ්‍යොතිෂය ඇසුරෙන් පැරැණි ඍෂිවරුන් අපට පෙන්වා දී ඇත්තේ දැවෙන තැවෙන ගැටලු ප්‍රශ්නවලට ජ්‍යොතිෂ ඇසින් පිළිතුරු වශයෙන්ය.

පැරැණි ඍෂිවරුන් පවසා ඇති පරිදි මෙකී දෝෂ තත්ත්වයන් වෙනස් වන පිහිටීම් බොහෝ ඇත. මෙවැනි ප්‍රබල කේන්ද්‍ර පිහිටීම් තුළ විවාහ දෝෂ භංග අඩු වීම, අහෝසි වී ශුභ ඵල උදාකර ගැනීමට හැකි වන පරිදි යෙදී තිබීම ඉතා වැදගත් වනු ඇත.

එම දෝෂ භංග වන අයුරු නම්,

1. කුජ ග්‍රහයා ස්වක්ෂේත්‍රව හෝ උච්චව ශුභ නැකැතක ශුභ දෘෂ්ටි ලැබ පාපකාරී නොවී යෙදීම, නැකැත් බලය යෙදීම මෙම දෝෂ තත්ත්වය අවම වේ.
2. ගුරු ග්‍රහයා ශුභව පිහිටීම. ගුරු ග්‍රහයාගේ දෘෂ්ටියට හසුවීම. මෙකී දෝෂ තත්ත්වය අවම වේ.
3. දෙදෙනාගේම කේන්ද්‍ර සටහනේ කුජ ග්‍රහයාගේ පිහිටීම මෙකී දෝෂ සහිත භාවයේ තැන්පත්වී සිටීම.
4. යෝගකාරක ග්‍රහයකු ලෙස කුජගේ ශක්තිය ප්‍රබලව පිහිටීම.
5. ශනි-රාහු යෝග වී මෙකී භාවයන්හි තැන්පත් වීම සහ ගුරුගේ බලවත් වීම, ශුභ දෘෂ්ටි ලැබීම.
6. හත්වැන්න දෝෂවලට හසු නොවීම මෙකී තත්ත්වයන් නිවැරැදි කේන්ද්‍ර පරීක්ෂාවකින් පසු කිව හැකි වන අතර, එවැනි වූ දෝෂවලට නිවැරැදි ග්‍රහ පූජා විධි, වත්පිළිවෙත් ක්‍රම, ග්‍රහ දාන, ග්‍රහ ශාන්ති කර්ම, සෙත්කවි කාව්‍ය රචනය කිරීම, සුදුසු ලෙස කේන්ද්‍ර පරීක්ෂා කිරීමෙන් පසු ඒ සඳහා සුදුසු යන්ත්‍ර පැලඳීම ආදී දෝෂ තත්ත්වයන්ට සුදුසු ක්‍රමවේද නිවැරැදි ලෙස අවබෝධයෙන් කරගැනීම තුළින් මෙකී පීඩාකාරී තත්ත්වයන් අවම කරගෙන ජීවිතය සාර්ථක කරගත හැකි බව මා මෙහි සඳහන් කරනුයේ නිවැරැදි ශාස්ත්‍රානුකූල ක්‍රමවේද හරහා ඔබ දැනුවත් වීම ඉතා ඵලදායී වන කටයුත්තක් ලෙසිනි.

ඉතින් විවාහ දෝෂ විවාහ ගැටලුවලට ඔබත් මුහුණ දෙන අයෙක්ද? ඔබගේ විවාහ සාර්ථක කරගැනීමට මෙවැනි කේන්ද්‍ර සටහනක් හිමි ඔබ තමාගේ ආවේගශීලී හැඟීම් සිතුවිලි පාලනය කරගත හැකි අතර, ආධ්‍යාත්මික ශක්තිය වඩවඩාත් ඉහළ මට්ටමක ගෙන ආ යුතුය. එවිට මෙකී තත්ත්වයන් මනා අවබෝධයෙන් පාලනය කරගැනීමටත් ජ්‍යොතිෂය ඇසුරින් ඔබේ ජීවිතය ආලෝකවත් කරගැනීමටත් ඔබට හැකිවනු නියතය. එසේ ඔබේ දිවිය ඔබ ආලෝකවත් කරගැනීමට සැබැවින් ඔබ දක්ෂයකු විය යුතු නොවේද? මෙවන් වූ හරබර ලිපි ඇසුරින් ඔබේ ජීවිතයට එන බාධා ජයගැනීමට ඔබට අත්වැලක් වීමට අප සූදානම්. නැවත මෙවන් වූ ලිපි පෙළකින් ඔබේ දිවි ගැටලුවලට පිළිතුරු රැගෙන එනතෙක් ඔබට සියලු යහපත උදා වේවා...

ජ්‍යොතිර්වේදිනී පී.එම්. සංජීවී වසන්ති



ජ්‍යොතිර් විද්‍යා ඩිප්ලෝමාධාරිනී / ජ්‍යොතිෂ ශිරෝමනී, ජ්‍යොතිෂ අවිශ්කාර් විශිෂ්ට ගෞරව සම්මානලාභිනී, සෙත්කවි ශාස්ත්‍ර විශාරද විශිෂ්ට ගෞරව සම්මානලාභිනී
සංජීවී ජ්‍යොතිර් පියස
දුරකතන - 0777 130391



# පත්තරෙන් නිවුස් දැනගෙන ෆේස්බුක් එකෙන් නිවුස් දැනගෙන අනේ ඉතින් අපි රට හදමු...

**දේශපාලනයේ සන්නිවේදන සෙල්ලම් හරි අපූරුය. බලයට එන්නට පෙර රටේ තොටේ හැම හුස්මකම සද්දය, පාරක යන බල්ලෙක් බුරන සද්දය පවා ඉතා සංවේදීව ඇසෙන නායකයන්ට, ඉහළ පුටුවල වාඩිවී රතු පළස් උඩින් ඇවිදින විට හිටිහැටියේම සන්නිවේදන අංශ අවිඥා වීම ලාංකීය දේශපාලනයේ සාමාන්‍ය සිරිතකි. මේ දිනවල රටේම අවධානය යොමුව තිබෙන බන්ධනාගාරයේ සිදුවූ මහා අර්බුදය සම්බන්ධයෙන් අධිකරණ ඇමැති හර්ෂණ නානායක්කාර මහතා අපූරු සහ අතිශය ළදරු කතාවක් කීවේය. ඒ, තමන්ට සෝෂල් මීඩියා හෙවත් සමාජ මාධ්‍ය බලන්නට වෙලාවක් නොතිබූ නිසා බන්ධනාගාර සිදුවීම ගැන විස්තර හරියටම දන්නේ නැති බවය. ඇමැතිවරයාගේ ඒ අහිංසක, 'මං සුදනා' ප්‍රකාශය ඇසූ කල අපට සිහිපත් වූයේ මේ රටේ අතීත පාලකයන් තොරතුරු දැනගත් සහ රට පාලනය කළ ආකාරයයි. අපට ඇති ප්‍රශ්නය නම්, රටේ මෙවැනි බරපතළ සිදුවීම් පාලකයන් දැනගත යුත්තේ උදේ පාන්දර පත්තර බලලාද, නැතිනම් රෑ බෝවෙලා සෝෂල් මීඩියා ස්ක්‍රෝල් කරලාද යන්නයි. රටක් පාලනය කරන නායකයන් සහ ඇමැතිවරුන් රටේ තොටේ තොරතුරු දැනගන්නට පත්තර හෝ ෆේස්බුක් දෙස බලා සිටිය යුතු නම්, එතැනින්ම ඒ පාලනයේ ඇති බංකොලොත්භාවය මැනවින් පැහැදිලි වේ.**

මේ කතාව ඇසෙන විට අපට නිතැතින්ම මතක් වන්නේ යහපාලන ආණ්ඩුව සමයේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා කියූ සුප්‍රසිද්ධ කතාවකි. එදා රටේ ලොකු ලොකු පෙරළි, දේශපාලන තීන්දු තීරණ සිදුවන විට එතුමා මාධ්‍ය අභිමුව අවංකවම පැමිණ කීවේ තමන්ද රටේ සිදුවන දේවල් උදේ පාන්දර දැනගන්නේ පත්තර බැලීමෙන් කියාය. ජනාධිපති කෙනෙක්, රටේ පළමුවන පුරවැසියා, මුළු රටේම බුද්ධි අංශ තමන්ගේ අණසක යටතේ තබාගෙන සිටින නායකයා රටේ තොරතුරු දැනගන්නට උදේ පත්තරේ එනකම් ඉන්නවා නම් එවැනි රාජ්‍ය නායකයෙකුගෙන් රටකට ඇති වැඩක් තිබේද කියා එදා ජනතාව ප්‍රශ්න කළහ. එදා පත්තරෙන් රටේ තොරතුරු සෙවූ ජනාධිපතිවරුන් දෙස බලා හිනාවුණු මිනිසුන්ට, අද සෝෂල් මීඩියා බලන්න වෙලාවක් තිබුණේ නැතැයි කියන ඇමැතිවරුන් දෙස බලා හඬන්නට සිදුව ඇත. පත්තරෙන් තොරතුරු සෙවූ යුගයේ සිට සෝෂල් මීඩියාවලින් තොරතුරු සොයන යුගය දක්වා අපේ රටේ පාලකයන්ගේ 'තොරතුරු දැනගැනීමේ' පරාසය වෙනස් වී ඇති අපූරුව කනගාටුදායකය.

නමුත් ඉතිහාසය දෙස බලන විට, ආර්. ප්‍රේමදාස වැනි ජනාධිපතිවරුන් උදේ පාන්දර හතරට පහට අවදි වී, තමන්ගේ තේ කෝප්පය මේසයට එන්නටත් පෙර රටේ පළවන සියලු පුවත්පත් තමන් ඉදිරියට ගෙන්වාගෙන කියවූ හැටි ප්‍රසිද්ධ කරුණකි. එතුමා පත්තර බැලුවේ රටේ තොරතුරු දැනගන්නට ක්‍රමයක් නැති නිසා නොවේ. පත්තරවල ලියැවෙන අඩුපාඩු සහ මහජන ප්‍රශ්න රතු පැනෙන් ලකුණු කර, උදේ හත වනවිට අදාළ අමාත්‍යාංශ ලේකම්වරයාට හෝ නිලධාරියාට දුරකතන ඇමතුමක් දී වහාම පියවර ගන්නැයි නියෝග කරන්නටය. ඔවුන් රටේ තොරතුරු දැනගැනීමට පත්තර පරිශීලනය කළත්, වගකිවයුතු පාලකයන් ලෙස තමන් සතු නිල රාජ්‍ය යාන්ත්‍රණය සහ නිලධාරීන් ලවා ඒවා තහවුරු කරගැනීමට කටයුතු කළහ. පාලකයා යනු නිලධාරීන්ට සහ සාමාන්‍ය ජනතාවට වඩා පියවර කිහිපයක් ඉදිරියෙන් සිටිය යුතු චරිතයක් බව ඔවුන් ක්‍රියාවෙන් පෙන්නුවේය. නමුත් අද වනවිට කතාව සම්පූර්ණයෙන්ම කණපිට හැරී, මුළු රාජ්‍ය සන්නිවේදනයම හාස්‍යයට කරුණක් බවට පත්ව ඇත.

අද රට පාලනය කරන ඇමැතිවරුන් සහ උසස් නිලධාරීන් තමන්ගේම විෂය පථයට අදාළ බරපතළ සිදුවීම් පවා දැනගන්නට බලන් සිටින්නේ ෆේස්බුක් එකේ පෝස්ට් එකක් වදිනකම් හෝ ටික්ටොක් වීඩියෝ එකක් ලයිව් එනකම්ය. රටේ බුද්ධි අංශ, අමාත්‍යාංශ ලේකම්වරුන්, දැස් සහ දෑත් මෙන් ක්‍රියා කළ යුතු රාජ්‍ය නිලධාරි පැලැන්තිය සහ රාජ්‍ය සන්නිවේදන ජාලයන් නඩත්තු කිරීම වෙනුවෙන් මහජන මුදල් කෝටි ප්‍රකෝටි ගණනින් වියදම් කරන්නේ ඇයිදැයි අපට සිතෙන්නේ එවිටය. ඇමැතිවරයෙකුට රටේ තීරණාත්මක තොරතුරක් දැනගන්නට සෝෂල් මීඩියා බලනකම් ඉන්නට සිදුවන්නේ නම්, ඔය කියන නිලතල, වගකීම් සහ වරප්‍රසාදවල ඇති එලක් තිබේද? ඇමැතිවරුන්ට සහ රජයට නිල තොරතුරු සැපයිය යුත්තේ රාජ්‍ය බුද්ධි අංශ සහ නිලධාරීන් මිස ෆේස්බුක් පේජ්කාරයන් නොවන බව මේ නවක පාලකයන්ට අමතක වීම ඛේදවාචකයකි. තමන්ගේ අමාත්‍යාංශය යටතේ පවතින බන්ධනාගාරයක මහා පෙරළියක් සිදුවන විට, ඒ බව නිලධාරීන්ගෙන් දැනගන්නට ක්‍රමයක් නැතිව, සෝෂල් මීඩියා බලන්න වෙලාවක් තිබුණේ නැතැයි කීම තරම් විහිළුවක් තවත් තිබේද?

කතාවේ ඇති ලස්සනම සහ හාස්‍යජනක හරය නම්, අද රටේ සාමාන්‍ය මිනිස්සු මේ සියලු දේශපාලකයන්ට සහ නිලධාරීන්ට වඩා සැතපුම් ගණනාවක් ඉදිරියෙන් සිටීමයි. රටේ කොහේ හෝ තැනක අසාධාරණයක්, දූෂණයක් හෝ බන්ධනාගාරයක මහා ප්‍රශ්නයක් සිදුවන විට, ඇමැතිතුමා කාර්යබහුලකම අස්සේ ෆේස්බුක් ලොග් වෙනකම් ඉන්නට සාමාන්‍ය ජනතාවට අවශ්‍ය නැත. ජනතාව ඒ සියල්ල ඇසිල්ලකින් දැනගෙන, විවේචනය කර, අවසාන නිගමනවලටත් පැමිණ ඉවරය. අවසානයේ සිදුවන්නේ, රටේ වැදගත්ම සහ සංවේදීම තොරතුරු ටික සාමාන්‍ය ජනතාවගෙන් හෝ මාධ්‍යවේදීන්ගෙන් අසා දැනගන්නට පාලකයන්ට සිදුවීමයි. රාජ්‍ය රහස් සහ තොරතුරු ගලා යායුත්තේ ඉහළ සිට පහළට මිස, පහළ සාමාන්‍ය ජනතාවගෙන් උඩ ඉන්නා ඇමැතිවරුන්ට නොවේ. සෝෂල් මීඩියා බලන්නට වෙලාවක් තිබුණේ නැතැයි කියමින් ඉතා සරලව ඇඟ බේරාගන්නා නායකයන් සිටින රටක, ඊළඟ වතාවේ රටේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් වූ ප්‍රශ්නයක් ගැන ඇසූ විට 'අනේ මගේ ඩේටා පැකේජ් එක ඉවර වෙලා තිබුණේ, සිග්නලුත් නැහැ, ඒකයි දන්නේ නැත්තේ' යැයි ඇමැතිවරුන් මාධ්‍ය හමුවල කියන දිනයද වැඩි ඈතක නොවේ. පාලකයන් පත්තරවලින් සහ සෝෂල් මීඩියාවලින් පමණක් රටේ තොරතුරු සොයන තාක්කල්, නිලධාරීන්ද තමන්ගේ වගකීම් පැත්තක දමා 'ලයික් සහ කමෙන්ට්' ගණන් කරමින් සිටිනු ඇත. අවසානයේ මඩ සෝදාගත් ගොවියාට පමණක් නොව, ස්මාර්ට් ෆෝන් එක අතට ගත් සාමාන්‍ය මිනිසාට ද සිදුවන්නේ මේ 'ඇනලොග්' මානසිකත්වයේ සිටින පාලකයන්ව 'ඩිජිටල්' ක්‍රමයටම දේශපාලන වේදිකාවෙන් ඩිලීට් කර ගෙදර යවන්නටය.

*මාර්කස් ප්‍රනාන්දුපුල්ලේ*



### 05. ජූලම්පිටිය අමරේ නායකත්වය දුන් තංගල්ල බන්ධනාගාර කැරැල්ල - 2002 ජූනි 30

බන්ධනාගාර ඉතිහාසයේ සිදුවූ තවත් දරුණු කැරැල්ලක් ඇතිවන්නේ තංගල්ල බන්ධනාගාරය තුළය. ඒ 2002 වසරේ ජූනි 30 වැනිදාය. සිරකරුවන් විසින් බන්ධනාගාරයේ පාලනය සියතට ගෙන කළ ඒ කැරැල්ල ආන්දෝලනයට තුඩුදුන්නකි.

බන්ධනාගාරයේ අවි ගබඩාවද බිඳ ගිනි අව්වලින් සන්නද්ධ වූ සිරකරුවන්ට නායකත්වය දෙනු ලැබුවේ ජූලම්පිටියේ අමරේ නමැති පාතාලයේ ප්‍රබලයෙකි. දේශපාලන අතින් රාජපක්ෂ පවුලට හිතවතතෙක් වූ ජූලම්පිටියේ අමරේ මේ වනවිට සිටින්නේ මරණීය දණ්ඩනයට නියම වූ සිරකරුවෙක් ලෙසිනි.

බන්ධනාගාරය තුළ රඳවා සිටි විවිධ අපරාධවලට සැකපිට සිටි යුද හමුදා සේවයෙන් පලාගිය සෙබළුන් පිරිසක් විසින් මෙම කැරැල්ල සැලසුම්සහගතව ආරම්භ කළ බව විමර්ශනවලින් අනාවරණ විය. අවි ගබඩාව බිඳ ගිනි අව්වලින් සන්නද්ධ වූ රැඳවූවන් 400ක් පමණ දෙනා බන්ධනාගාර නිලධාරීන් පවා ප්‍රාණ ඇපයට ගත්තේය. ඒ අතර නිලධාරීන් 10 දෙනෙක් සිටියේය.

පැරණි ලන්දේසි බළකොටුවක් වූ තංගල්ල බන්ධනාගාරයේ මුරටැඹ මතට නැගුණු සන්නද්ධ රැඳවියෝ, පිටත සිටි ආරක්ෂක අංශ වෙත වෙඩි ප්‍රහාරද එල්ල කළහ. එහිදී දෙපාර්ශ්වය අතර වූ වෙඩි හුවමාරුවලින් 07 දෙනෙක් පමණ තුවාල ලැබීය. රැඳවූවන් මෙසේ බන්ධනාගාරය තුළ කැරලි ගැසුවේ තම නඩුවලට අදාළ විමර්ශන කටයුතු කඩිනම් කරන ලෙස ඉල්ලමිනි. බන්ධනාගාරය තුළ පවතින දුෂ්කර ජීවන තත්ත්වයන් ගැන කියමින් පහසුකම් වහාම නංවාලන ලෙස ඔවුහු ඉල්ලා සිටියහ.

ජූනි 30දා ඇරඹි කැරැල්ල සාමකාමීව විසඳෙන්නේ ජූලි 01 වැනිදාය. ඒ, දේශපාලන මැදිහත්වීමකින් අනතුරුවය. එවක රටේ නායිකාව ලෙස චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය සිටියද බලය පැවැතියේ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා යටතේය. ආණ්ඩුව පැවැතියේ රනිල් අතේය. රනිල්ගේ ආණ්ඩුවේ බන්ධනාගාරය භාරව තිබුණේ අභ්‍යන්තර කටයුතු ඇමැති ජෝන් අමරතුංග මහතා යටතේය. එදා ඔහු කැරැල්ලට නැවතීමේ තිත තැබීමට එන්නේ එවක විපක්ෂ නායකයා වූ මහින්ද රාජපක්ෂ මහතා සමගිනි. 'අමරේ, මම මහින්ද මහත්තයා' යැයි තාප්පෙන් එපිට සිට පවසමින් එදා කැරැලිකරුවන් අත වූ ආයුධ බිම තබා සාකච්ඡාවකට ඔවුන්ව ගෙන්වන්නේ මහින්ද රාජපක්ෂ මහතාය. එසේ නොවන්නට තංගල්ල බන්ධනාගාරය තුළ එදා ඇතිවූ කැරැල්ල මැඬලීමට සිදුවන්නේ මෙරට ඉතිහාසයේ ලේ වැගිරීම් සහ මිනිස් ජීවිත විශාල ගණනක් අහිමිකරමිනි.

### 06 බෝගම්බර බන්ධනාගාරයේ - 2010 මාර්තු 10

බෝගම්බර බන්ධනාගාරය තුළද විටින් විට රැඳවූවන් සහ නිලධාරීන් අතර ගැටුම් ඇතිවී ඇත. වඩාත් අවධානයට ලක්වූ සිදුවීම වාර්තා වන්නේ 2010 මාර්තු 10දාය. මෙය බන්ධනාගාර නිලධාරීන් සහ රැඳවියන් අතර ඇති වූ ඍජු ගැටුමකි.

බන්ධනාගාරය තුළට රහසිගතව රැගෙන විත් තිබූ මත්ද්‍රව්‍ය සහ ජංගම දුරකතන සෙවීම සඳහා බන්ධනාගාර බුද්ධි අංශය සහ නිලධාරීන් කළ විශේෂ සෝදිසියට විරෝධය දක්වමින් රැඳවූවන් ගැටුමක් ඇතිකර ගත්තේය. නිලධාරීන් විසින් සිරකරුවන් සතු ජංගම දුරකතන කිහිපයක් සහ මත්ද්‍රව්‍ය පාර්සල් අත්අඩංගුවට ගැනීමත් සමග, ප්‍රධාන අපරාධ කල්ලිවලට සම්බන්ධ රැඳවියන් පිරිසක් අනෙක් සිරකරුවන් ද පොලඹවා ගනිමින් ඇතිකරගත් ගැටුම වර්ධනය වන්නේ බන්ධනාගාරය තුළ තිබූ දේපළවලට හානිකරමිනි.

200කට අධික රැඳවූවන් පිරිසක් බෝගම්බර බන්ධනාගාරයේ මහල් තුනකින් යුත් ඓතිහාසික ගොඩනැගිල්ලේ වහල මතට නැගී කලහ කළහ. ඔවුන් වහලයේ උළු කැට ගලවමින් සහ බන්ධනාගාර තාප්පවල කොටස් කඩාගනිමින් බන්ධනාගාර නිලධාරීන්ට සහ පිටත සිටි පොලිස් නිලධාරීන්ට පහරදුන්නේය. බන්ධනාගාර සහ පොලිස් නිලධාරීන් 10කට වැඩි පිරිසක් මෙහිදී තුවාල ලැබීය.

බන්ධනාගාරයේ ඇතැම් වාට්ටුවල තිබූ මෙට්ට සහ ලිපිගොනු එකතු කර ඒවාට ගිනි තබමින් ඔවුහු බන්ධනාගාරය පුරා නොසන්සුන්කාරී වාතාවරණයක් මැවූහ. තත්ත්වය පාලනය කිරීමට සිදුවන්නේ කඳුළු ගෑස් ප්‍රහාර එල්ලකරමිනි. මෙහිදී රැඳවූවන්ද විශාල පිරිසක් තුවාල ලැබීය.

### 7. සිරකරුවන් 02කට මරණය ගෙන දුන් අනුරාධපුර ගැටුම - 2011 ජනවාරි 24

බන්ධනාගාරය තුළ තමන්ට ලැබෙන පහසුකම් ප්‍රමාණවත් නොවන බව පවසමින් අනුරාධපුර බන්ධනාගාරයේ රැඳවූවන් පිරිසක් විසින් 2011 වසරේ ජනවාරි අරඹනු ලබන උපවාසය අවසන් වන්නේ වෙඩි ප්‍රහාරයකට ලක්ව රැඳවූවන් දෙදෙනෙක් වෙඩි පහරකින් මියගොස් තවත් 24 දෙනෙක් තුවාල ලබමිනි.

උපවාසය ආරම්භ වන්නේ 50කට අධික රැඳවූවන් පිරිසක් බන්ධනාගාරයේ වහල මත නැගී ආහාර වර්ජනය කරමිනි. ඔවුන්ගේ ප්‍රධාන ඉල්ලීම් වූයේ තමන්ව බැලීමට පැමිණෙන මවුවරුන්, භාර්යාවන් ඇතුළු පවුලේ අයට බන්ධනාගාර නිලධාරීන් විසින් අසභ්‍ය සහ රළු වචනවලින් බැණවැදීම නතර කරන ලෙසය.

නිවෙස්වලින් රැඳවියන් වෙනුවෙන් රැගෙන එන කෑම පාර්සල් නිලධාරීන් විසින් පරීක්ෂා කිරීමේ මුවාවෙන් අතගා, ආහාරයට ගත නොහැකි තත්ත්වයට පත්කිරීම නතර කිරීම, නැරඹුම් කාලය දීර්ඝ කිරීමද ඔවුන්ගේ ඉල්ලීම් අතර විය. එවක අනුරාධපුර බන්ධනාගාර ප්‍රධානියා වහාම ක්‍රියාත්මක වන පරිදි මාරුකර යැවීම, රිමාන්ඩ් සිරකරුවන් සඳහා ඇප ලබාගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම ආදී ඉල්ලීම්ද ඊට අමතරව ඔවුන් ඉදිරිපත් කරනු ලැබීය.

දින කිහිපයක් තිස්සේ පැවැති මෙම උපවාසය සම්බන්ධයෙන් බන්ධනාගාර බලධාරීන් සහ රැඳවියන් අතර පැවැති සාකච්ඡා අසාර්ථක විය. බලධාරීන් රැඳවියන්ගේ ඉල්ලීම්වලට ඇහුම්කන් දෙනවා වෙනුවට විරෝධතාව වහාම නවත්වන ලෙස බලපෑම් කළේය. එහිදී ඇති වූ උණුසුම් තත්ත්වය පාලනය කිරීමට සහ රැඳවූවන් පලායාමට උත්සාහ කරන බව පවසමින් බන්ධනාගාර නිලධාරීන් විසින් රැඳවූවන් වෙත ඍජුවම වෙඩි තැබුවේය. ඒ, ජනවාරි 24 වැනිදාය. එහිදී ඇතිවන ගැටුම්වලින් බන්ධනාගාර නිලධාරීන් 08 දෙනකුටද තුවාල සිදුවිය.

ආසියානු මානව හිමිකම් කොමිසම ඇතුළු සංවිධාන විසින් මෙම වෙඩිතැබීම සහ රැඳවියන් ඝාතනය කිරීම සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් පවත්වන ලෙස එවක රජයෙන් දැඩි ලෙස ඉල්ලා සිටියත් එවැනි විමර්ශනයක් සිදුවූ බවක් දැන ගන්නට නැත.

### 08. මැගසින් බන්ධනාගාරයේ කැරැල්ල - 2012 ජනවාරි 24

මැගසින් බන්ධනාගාරයේදී රටම හෙල්ලූ ගැටුමක් සිදුවන්නේ 2012 වසරේ ජනවාරි 24 වැනිදාය. බන්ධනාගාරයේ ලේඛන, මුළුතැන්ගෙය, පුස්තකාලය ආදිය ගිනිතබා රැඳවූවන් නොසන්සුන්ව හැසිරීම නිසා එය පාලනය කිරීමට ආරක්ෂක අංශ නිලධාරීන්ට සිදුවූයේ කලහකාරී රැඳවූවන්ගේ දණහිසෙන් පහළට වෙඩි තබන්නය. එහිදී තුවාල වූ රැඳවූවන් ගණන 31කි. ජීවිත හානියක් ගැන වාර්තා වූයේ නැත. කලහකාරීන් බන්ධනාගාරයේ ඇති වෛද්‍ය මධ්‍යස්ථානය කඩා එහි වූ මානසික රෝගීන්ට ලබාදෙන ඖෂධ පෙති වර්ගයක් පානය කර තිබුණේ අහුරු පිටිනි. ඒ නිසාම රැඳවූවන් මත්වී හැසිරී තිබුණේ පිස්සන් මෙන්ය.

බන්ධනාගාරය තුළ සිදුවන මත්ද්‍රව්‍ය ජාවාරම් සහ ජංගම දුරකතන භාවිතය මැඬපැවැත්වීමට බලධාරීන් ගත් ක්‍රියාමාර්ගවලට විරෝධය දක්වමින් මත්ද්‍රව්‍ය ජාවාරමට සම්බන්ධ පිරිසක් විසින් මෙම තත්ත්වය නිර්මාණය කළ බව එකල පැවති විමර්ශනවලින් අනාවරණ වී තිබිණි. බන්ධනාගාරයේ වහලය මතට පවා නැගුණු රැඳවූවන් විරෝධතාවල නිරත විය. තත්ත්වය පාලනය කිරීමට මුලින්ම කඳුළු ගෑස් ප්‍රහාර එල්ලකර තිබුණි. වෙඩි තබන්නේ බැරිම තැනය.

මේ ගැන විමර්ශන පවත්වන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසිනි. ගැටුමට සම්බන්ධ රැඳවූවන් හඳුනාගත් අතර ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක වූ බවක් දැනගන්නට නැත. බන්ධනාගාර දේපළවලට වූ හානිය තක්සේරු කර තිබුණේ රුපියල් මිලියන 7.5ක් ලෙසිනි.

### 09. 27 දෙනකු ඝාතනය වූ වැලිකඩ බන්ධනාගාරයේ කැරැල්ල - 2012 නොවැම්බර් 09

බන්ධනාගාර ඉතිහාසයේ දරුණුතම හා වඩාත්ම ආන්දෝලනයට තුඩුදුන් සිදුවීමක් වන්නේ වැලිකඩ බන්ධනාගාරය තුළ 2012 වසරේ නොවැම්බර් 27 වැනිදා සිදුවූ නොසන්සුන් තත්ත්වයයි. එය රැඳවියන් පිරිසක් විසින් ආරක්ෂක අංශවලට එරෙහිව දියත් කළ කැරැල්ලක් යැයි සඳහන් කළහොත් වරදක් නැති තරම්ය. මෙම කැරැල්ලේදී රැඳවූවන් 27 දෙනෙක් ඝාතනය විය. තුවාල ලැබූ ගණන 40කට වැඩිය.

ඒ අතර එවක පොලිස් විශේෂ කාර්ය බළකායේ අණදෙන නිලධාරීයාව සිටි නියෝජ්‍ය පොලිස්පති ආර්.ඩබ්ලිව්.එම්.සී. රණවන මහතා ඇතුළු විශේෂ කාර්ය බළකායේ පමණක් නිලධාරීන් 13ක් සිටියේය. 04 දෙනෙක් යුද හමුදාවේය. මේ අය තුවාල ලබන්නේ රැඳවූවන් විසින් කළ වෙඩිතැබීම්වලිනි.

රැඳවූවන්ගෙන් වැඩි දෙනෙක් මියගොස් තිබුණේ ආරක්ෂක අංශ විසින් කළ වෙඩිතැබීම්වලිනි. නිරායුධ රැඳවූවන් නම් කතාකර පෝලිම් කරවා බිම දණගස්සවා වෙඩිතැබූ බවට චෝදනාද එල්ලවිය. ඒ නිසාම මෙම සිදුවීම ජාත්‍යන්තරය ඉදිරියේ ශ්‍රී ලංකාවට කළු පැල්ලමක් එල්ල කළ මෙරට බන්ධනාගාරයක් තුළ සිදුවූ ම්ලේච්ඡතම සිදුවීම්වලින් එකකි.

බන්ධනාගාරය තුළ සිටින රැඳවූවන් ජංගම දුරකතන භාවිත කරමින් ව්‍යාපාරිකයන් ඇතුළු පුද්ගලයන්ට ඇමතුම් දෙමින් සිදුකරන බියගැන්වීම් සහ කප්පම් ගැනීම් මෙන්ම මත්කුඩු ජාවාරම පාලනය කිරීමට එවක පැවැති රාජපක්ෂ රජය විසින් බන්ධනාගාර නිලධාරීන්ට අමතරව පොලිසිය යොදා බන්ධනාගාරය තුළ සෝදිසි මෙහෙයුම් කරනු ලැබීය. මැගසින් බන්ධනාගාරය තුළද ඊට පෙර නොසන්සුන් තත්ත්වයක් ඇතිවන්නේ එම සෝදිසිකිරීම්වලට එරෙහිවය.

එහි තියුණු අවස්ථාවක් ලෙස වැලිකඩ නොසන්සුන් තත්ත්වය හැඳින්විය හැකිය. බන්ධනාගාර වාට්ටු පරීක්ෂා කිරීමට ගිය විශේෂ කාර්ය බළකා නිලධාරීන් පිරිසකට පහරදීමත් සමග ඇතිවූ එම නොසන්සුන් තත්ත්වය හමුවේ රැඳවූවෝ බන්ධනාගාරයේ අවි ගබඩාව බිඳ ගිනිඅවිද ගත්හ. ටී 56 අව්වලින් සන්නද්ධ වූ රැඳවූවන් කඳුළු ගෑස් ප්‍රහාර මගින් පාලනය කිරීමට ඉඩක් නොවීය. සිදුවන්නේ ආරක්ෂක අංශ සහ රැඳවූවන් අතර වෙඩි හුවමාරුය. අවසානයේදී රැඳවූවන් 27 දෙනෙක් මියයන්නේ රට තුළ ඒ ගැන ලොකු සංවාදයක්ද ඇතිකරවමිනි.

මේ ගැන දේශපාලන වේදිකාවේ පවා බරපතළ කතාබහක් ඇතිවන්නට විය. රාජපක්ෂ ආණ්ඩුව සමයේදී මේ සිදුවීම යටපත්ව තිබුණත් 2015 යහපාලන ආණ්ඩුව බලයට ඒමත් සමග නැවත ඒ ගැන සමාජයේ යම් කතිකාවක් ඇතිවන්නට ගත්තේය. ඒ අනුව විශ්‍රාමික මහාධිකරණ විනිසුරු විමල් නම්බුවසම් මහතාගේ සභාපතිත්වයෙන් යුතු ත්‍රිපුද්ගල විමර්ශන කමිටුවක්ද පත්කරනු ලැබීය. විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අශෝක විජේතිලක සහ විශ්‍රාමික පරිපාලන නිලධාරී එස්.කේ. ලියනගේ මහත්වරු එහි සෙසු සාමාජිකයන්ය. සිය වාර්තාව මගින් ඔවුන් පෙන්වා දෙන්නේ කැරැල්ල පාලනය කිරීමෙන් පසුව, ආරක්ෂක අංශ භාරයේ සිටි රැඳවියන් තෝරාගෙන සැලසුම්සහගතව ඝාතනය කර ඇති බවය.

ඒ වනවිට මේ ගැන විමර්ශන පවත්වන්නට යෙදුණේ බොරැල්ල පොලිසිය සහ කොළඹ අපරාධ කොට්ඨාසය මගිනි. යහපාලන ආණ්ඩුව එම විමර්ශන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාරදීමට කටයුතු කළේය. සිද්ධිය ඇසින් දුටු රැඳවියන්, බන්ධනාගාර ආරක්ෂකයන් සහ වෛද්‍යවරුන් ඇතුළු විශාල පිරිසකගෙන් සාක්ෂි එහිදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් සටහන් කරගන්නා ලදී. ඝාතනයට ලක්වූ රැඳවියන්ගේ සිරුරු අසලින් හමුවූ ගිනිඅවි, ආරක්ෂක අංශ විසින් පසුව ගෙනැවිත් තබන ලද ව්‍යාජ සාක්ෂි බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විද්‍යාත්මක විමර්ශනවලදී ඔප්පු කරනු ලැබීය. ඒ ඡායාරූප සාක්ෂිද සමගිනි. අවසානයේදී මේ සම්බන්ධයෙන් සැකකරුවන් දෙදෙනෙක් අත්අඩංගුවට ගත්තේය. ඒ පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ හිටපු පොලිස් පරීක්ෂක නියෝමාල් රංගජීව සහ එවක බන්ධනාගාර අධිකාරීවරයෙක් ලෙස සේවයේ නිරතව සිටි එමිල් රංජන් ළමාහේවා යන දෙදෙනාය. නියෝමාල් රංගජීව 2018 මාර්තු 28 වැනිදාත් එමිල් රංජන් ඊට පසුදිනත් අත්අඩංගුවට ගන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසිනි. බන්ධනාගාරයේ තවත් සැකකරුවන් දෙදෙනෙක් සිටියද ඔවුන් ඒ යන විට රටින් පලාගොස් සිටි බැවින් අත්අඩංගුවට ගැනීමක් සිදුවූයේ නැත.

කමිටු වාර්තාව මෙන්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශන වාර්තා පදනම් කරගෙන නීතිපතිවරයා විසින් කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණය හමුවේ මේ සම්බන්ධයෙන් නඩු පවරනු ලැබුවේ චෝදනා 33ක් යටතේය. 2022 වසරේ ජනවාරි 12 වැනිදා නඩු තීන්දුව ලබාදෙන්නේ නියෝමාල් රංගජීව නිදහස් කරමින් එමිල් රංජන් ළමාහේවාට මරණ දඬුවම පනවමිනි. එම නඩු තීන්දුවට එරෙහිව එමිල් රංජන් ළමාහේවා ශ්‍රේෂ්ඨාධිකරණයට ගියේය. එහි තීන්දුව 2024 අගෝස්තු 08 ප්‍රකාශයට පත්කරන්නේ ඔහුවද නිදහස් කරමිනි.

### 10. සිරකරුවන් 02කට මරු කැඳවූ අනුරාධපුර බන්ධනාගාරයේ ගැටුම - 2020 මාර්තු 21

අනුරාධපුර බන්ධනාගාර ඉතිහාසයේ තවත් දරුණු සිදුවීමක් වාර්තා වන්නේ 2020 මාර්තු 21දාය. ඊට මුල්වන්නේ බන්ධනාගාර පද්ධතිය තුළ කොවිඩ් 19 වෛරසය සම්බන්ධයෙන් ඇතිවූ බියයි. ඒ වනවිට රට තුළ කොරෝනා වෛරසය වේගයෙන් පැතිර යමින් තිබූ බැවින් බන්ධනාගාරයේ අධික තදබදය නිසා තමන්ට ද වෛරසය වැළඳෙනු ඇතැයි රැඳවූවන් තුළ දැඩි බියක් හටගෙන තිබුණි. ඒ නිසා තමන්ව වහාම ඇප මත මුදාහරින ලෙස හෝ වෙනත් ආරක්ෂිත ස්ථානයකට මාරුකරන ලෙස ඉල්ලා රැඳවූවන් පිරිසක් බන්ධනාගාර පාලනාධිකාරියට බලපෑම් කරන්නට වූහ. ඊට නිසි ප්‍රතිචාර නොවූ තැන රැඳවූවන් නොසන්සුන් වෙමින් කලහකාරී ලෙස හැසිරෙමින් බන්ධනාගාරයේ වූ දේපළවලට ගිනිතබා හානිකරන්නට ගත්තේය.

බන්ධනාගාරයේ ඖෂධ ගබඩාවට සහ ලේඛන කාමරයට ගිනි තබා පලායාමට උත්සාහ කළහ. විශාල පිරිසක් බන්ධනාගාරයේ ප්‍රධාන දොරටු සහ තාප්ප බිඳදමමින් පලායන්නට උත්සාහ ගත්තේය. තත්ත්වය පාලනය කිරීමට පොලිසිය සහ පොලිස් විශේෂ කාර්ය බළකාය බන්ධනාගාරය වෙත කැඳවනු ලැබීය. තත්ත්වය පාලනය කිරීමට ඔවුන්ට සිදුවන්නේ වෙඩිතැබීමටය. මෙම වෙඩිතැබීම්වලින් රැඳවියන් දෙදෙනෙකු මියගිය අතර, තවත් රැඳවියන් සහ බන්ධනාගාර නිලධාරීන් ඇතුළු 06 දෙනකු දරුණු ලෙස තුවාල ලැබූහ.

මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් විමර්ශනයක් පැවැත්වූවද අදටත් එම විමර්ශනයේදී සිදුවූ දෙයක් වාර්තා වන්නේ නැත. මෙහි අවසාන ප්‍රතිඵලය වූයේ බන්ධනාගාරයේ ආරක්ෂාව තහවුරු කිරීමට සහ රැඳවියන් පලායාම වැළැක්වීමට සිදුකළ 'අවම බලය සහ නීත්‍යනුකූල රාජකාරිමය පියවරක්' ලෙස බව කියමින් රජය සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් වෙඩිතැබීම සාධාරණීකරණය කිරීමය.

ගෝඨාභය ආණ්ඩුව පැවැති එකල බන්ධනාගාර විෂය අධිකරණ අමාත්‍යාංශය යටතේ පැවැති අතර අධිකරණ අමාත්‍යවරයා ලෙස අලි සබ්‍රි මහතා කටයුතු කළේය. බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යවරයා වූයේ ලොහාන් රත්වත්තේ මහතාය.

### 11. සිරකරුවන් 11කට මරණය ගෙනදුන් මහර බන්ධනාගාරයේ ගැටුම - 2020 නොවැම්බර් මස 29 සහ 30

කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ මහර බන්ධනාගාරය තුළද නොසන්සුන් තත්ත්වයන් දිගින් දිගටම ඇතිවිය. එහි උච්චතම අවස්ථාව උදාවන්නේ 2020 වසරේ නොවැම්බර් 29 සහ 30 දෙදින තුළය.

තමන්ට පී.සී.ආර්. පරීක්ෂණ සිදුකරන ලෙසත්, කොවිඩ් ආසාදිත රැඳවූවන් සාමාන්‍ය රැඳවූවන්ගෙන් වෙන්කරන ලෙසත් සහ තමන්ට ඇප ලබාදෙන ලෙසත් රැඳවියන් කළ ඉල්ලීම්වලට නිසි ප්‍රතිචාර නොලැබීම මුල්කරගෙන රැඳවූවන් නොසන්සුන් වන්නේ බන්ධනාගාරයේ දේපළවලට හානිකරමිනි.

බන්ධනාගාර වෛද්‍ය කාමරය බිඳ එහි තිබූ මානසික රෝග සඳහා දෙන ඖෂධ වර්ග අධික ලෙස පානය කර දේපළවලට ගිනි තබමින් ප්‍රචණ්ඩව හැසිරෙන විට පාලනය කිරීමට බන්ධනාගාර නිලධාරීන් පියවර ගන්නේ වෙඩි තබාය. එහිදී රැඳවූවන් 11 දෙනෙක් මියගොස් 100කට වැඩි පිරිසක් තුවාල ලැබීය. මේ සිදුවීම වනවිට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වත්මන් අධ්‍යක්ෂ නියෝජ්‍ය පොලිස්පති ශානි අබේසේකර මහතා රඳවා සිටියේ මහර බන්ධනාගාරයේය. එදා ඔහුගේ ජීවිතයට පවා අවදානමක් ඇතිව තිබුණු බව කියැවිනි.

බන්ධනාගාරයේ අවි ගබඩාව අත්පත්කර ගැනීමටද එදා රැඳවූවන් උත්සාහයක් දැරුවද එය ව්‍යාර්ථ කිරීමට බන්ධනාගාර නිලධාරීන් සමත්වීම හේතුවෙන් සිදුවීමට ගිය මහා විනාශයක් වැළකී ගිය බව බන්ධනාගාර පාර්ශ්වයෙන් එදා කීවේය. රැඳවූවන් 11 දෙනාගේ මරණය ගැන එකල පැවති ගෝඨාභය රජය ප්‍රකාශ කළේ බන්ධනාගාරය තුළ ඇතිවූ තත්ත්වය පාලනය කිරීමට ආරක්ෂක අංශවලට බලය භාවිත කිරීමට සිදුවූ බවය. ඒත් එක්කම ආණ්ඩුව එම සිද්ධියේ සම්පූර්ණ වගකීම භාරගත්තේය. මෙහිදී බන්ධනාගාරයට රුපියල් කෝටි 06කට අධික දේපළ හානියක් සිදුව තිබූ අතර, ඒ සම්බන්ධයෙන් රැඳවූවන් 120කට නඩු පැවරීමක්ද සිදුකරනු ලැබීය.

ගෝඨාභයගේ ආණ්ඩුව මෙම මරණ යටපත් කිරීමට දැඩි උත්සාහයක් ගත්තද පසුකාලීනව සිදුකළ මහෙස්ත්‍රාත් පරීක්ෂණයේදී තීන්දු කෙරුණේ මෙම රැඳවියන් 11 දෙනාගේ මරණ වෙඩිතැබීම් හේතුවෙන් සිදුවූ සාපරාධී ක්‍රියාවක් බවය. අධිකරණය විසින් සැකකරුවන් අත්අඩංගුවට ගන්නා ලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නියෝගයක් කර ඇති අවස්ථාවකදී පවා නීතිපති දෙපාර්තමේන්තුව පෙනී සිටියේ බන්ධනාගාරය වෙනුවෙනි. ඒ බන්ධනාගාර ආඥා පනතේ 77 වගන්තිය ප්‍රකාරව මෙම වෙඩි තැබීම නිලධාරීන්ගේ 'ස්වයං ආරක්ෂාව සඳහා' කළ එකක් බව පවසමිනි. ඒ අනුව නඩුව වසාදැමීමට නීතිපතිවරයා පියවර ගැනීමත් සමග අභියාචනාධිකරණයේ එය මේ වනවිට අභියෝගයට ලක්කර ඇත්තේ මියගිය රැඳවූවකුගේ බිරිඳක් විසිනි.

*රුවන් වෙඩිවර්ධන*



## LANKA TRACTORS, ACE ට්‍රැක්ටර් වෙළෙඳපොළට හඳුන්වාදෙයි

ශ්‍රී ලාංකීය කෘෂි ක්ෂේත්‍රයේ විශ්වාසවන්ත නාමයක් දිනාගත්, Lanka Tractors සමාගම, කොළඹ 11, ඕල්කට් මාවතේ අංක 343 දරන ස්ථානයේ පිහිටි තම මුල් ප්‍රදර්ශනාගාරය යළි විවෘත කරමින්, ACE ට්‍රැක්ටර් සන්නාමය නිල වශයෙන් ශ්‍රී ලංකාවට හඳුන්වාදෙන ලදී. මෙය, ශ්‍රී ලාංකීය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම සමාගමක ආකර්ෂණීය පුනරාගමනය සනිටුහන් කරන සුවිශේෂ අවස්ථාවකි.

ඒ නිමිත්තෙන් පැවැති සුවිශේෂ උළෙල වර්ණවත් කරමින්, අරලිය සමූහ ව්‍යාපාරයේ සභාපති ඩඩ්ලි සිරිසේන මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ඊට සහභාගි විය. ලංකා ට්‍රැක්ටර්ස් සමාගමේ සභාපති උපුල් ජයසූරිය මහතා, කළමනාකාර අධ්‍යක්ෂ තිලිණ අබේසූරිය මහතා, එම සමාගමේ ව්‍යාපාර ප්‍රධානී නිශාන්ත යාපා මහතා සහ Asia Asset Finance PLC සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී රජීව් ගුණවර්ධන මහතා ඇතුළු පිරිසක්ද එම අවස්ථාවට එක්ව සිටියහ.

1971 දී රාජ්‍ය ට්‍රැක්ටර් සංස්ථාව ලෙස ආරම්භ වී, 1991 දී ප්‍රතිව්‍යුහගත කිරීමෙන් අනතුරුව ලංකා Lanka Tractors, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ ගෙන්වා බෙදාහැරීමෙහිලා දැවැන්ත කාර්යභාරයක් ඉටුකළ සමාගමකි. Massey Ferguson, Kubota සහ TAFE වැනි ලෝ සුපතල සන්නාමවල ට්‍රැක්ටර් හා යන්ත්‍රෝපකරණ පමණක් නොව, කෘෂි ක්ෂේත්‍රයේ විශේෂඥ සහය හා විශ්වාසවන්ත අලෙවියෙන් පසු සේවාවද, දශක ගණනාවක් ශ්‍රී ලාංකීය ගොවි ජනතාවට විශ්වසනීය ලෙස පිරිනමමින් සමාගම සිදුකළ මෙහෙය සුළුපටු නොවේ.

*ප්‍රියන්ත හෙට්ටිගේ*




# මීගමුව හිර ගෙදර ගිනි ගත්ත හැටි

## එළියේ කතාව

**රාත්‍රිය උදාවෙන්නේ මහ පොළොව නිවන්න. දවස තිස්සේ වෙහෙස වෙච්ච ඉර රෑ වෙනකොට මුහුදට බහිනවා. ඊත් ඉර බැහැලා ගියාට පස්සේ ඉර බැහැලා ගිය තැන අහසේ රතු පාට ලප කැළැල් තැන් තැන්වල ඉතුරු වෙනවා. හරියට ඈතට පේන්නේ ලේ සලකුණු වගේ. ඕනෙ නම් කෙනකුට කියන්න පුළුවන් අහසට වෙඩි තියලා ඉර හොරු අරන් ගිහිල්ලා කියලා. නැත්නම් තව කෙනකුට කියන්න පුළුවන් ඉර මරලා දාලා කියලා. අහසෙයි මුහුදෙයි හැමතැනම ගෑවිලා තියෙන්නේ මැරුණු ඉරේ ලේ සලකුණු කියලා. කොහොම වුණත් ඉර ආයෙ පහුවදා උදේ උපදිනවා.**

අහස කොච්චර රතු වුණත්, මුහුද කොච්චර රතු වුණත්, අහසයි මුහුදයි දෙකම එකට කලවම් වෙලා ඒ ලේ හරියට අතුණුබහන්වල කැටිති කැටිති විසිරෙන ලේ වගේ සනකමට ඈතට පෙනුණත්, පහුවදාට ඉර උපදිනවා. උපදින්නේ ලස්සන අහසක. ඒ අහස ළා නිල් පාටයි. ඒ ළා නිල් පාට පසුබිම් කරගෙන රිදී පාට ලස්සන ඉරි ඇඳිලා තියෙනවා. ඒ ඉරි අතරින් තමයි ඉර පායන්නේ.

ඉර පායන්න කලින් එන්නේ ඉරිමාව. ඉරිමා උදේ අහස පාළුයි. ඉඳහිට දවසක හඳ ගෙදර යන්න පරක්කු වෙලා අහසේ නතර වෙලා හිටියොත් අපිට හඳ බලන්න පුළුවන්. එහෙම නැත්නම් ඉරත් හඳත් දෙකම නැති වෙලාවට නිල් පාට මන්දස්මිත ආලෝකයක් එක්ක මහ පොළොවට පිනි වැහි වැටෙනවා. ඒ පිනි බින්දු මල් පෙති අග රැඳෙනවා. ඉර පෑව්වම ඒ පිනි බින්දු පේන්නේ හරියට මැණික් කැට වගේ. ඒත් ඇත්තටම ඒවා මැණික් කැට නෙමෙයි. මේ පිනි බින්දු එකතු කරලා මාලයක් හදාගන්න පුළුවන් නම් ඒක මේ ලෝකේ තියෙන වටිනාම මාලෙට වඩා ලස්සන වෙයි. ඒත් ඉර පායලා තත්පරයක්, දෙකක්, තුනක් යනකොට පිනි මල් එකින් එක අතුරුදන් වෙන්න පටන් ගන්නවා.

දවස තරුණ වෙනකොට ඉරට මහ පොළොවත් එක්ක හුරතල් වෙවී ඉන්න බෑ. මිනිස්සුත් තැන් තැන්වල තම තමන්ගේ වැඩරාජකාරි පටන් ගන්නවා. කලබලෙන් දුවනවා, බස් හෝන් ගහනවා, ළමයි ඉස්කෝලේ යනවා. පාරවල්වල තදබදය නිර්මාණය වෙනවා. කලර් ලයිට් ළඟ මිනිස්සු පොදි පොදි රංචු ගැහෙනවා. වේගෙන් වේගෙන් වේගෙන් දවස ගත වෙනවා. මම මේ කියන්නේ සාමාන්‍ය දවසක් ගැන. මේ ලිපිය පටන් ගන්න වෙන්නේ ඉරිදා හැන්දෑවෙන්. ඒ කියන්නේ අර මම කලින් කිව්ව ඉර මැරුණු වෙලාවෙන්.

හැම දේම වෙන්න වැඩි කාලයක් ගතවුණේ නෑ. අපි රෑ නිදාගත්තේ බන්ධනාගාර කලබලය ඉවරයි කියලා හිතාගෙන. ඒත් පහුවදාට එළිවෙලා වැඩි වෙලාවක් යන්නත් කලින් පණිවුඩයක් ආවා, ආයෙත් බන්ධනාගාර පැත්තේ කලබලයි කියලා. පත්තරකාරයෝ විදියට අපිට තියෙනවා උණක්. කලබලයක් ඇතිවෙනකොට එතැනට දුවගෙන යන. ප්‍රසංගවල ඉදිරි පුටුවල අපි මාධ්‍යවේදීන් විදියට පෙනී සිටින්නේ නැති වුණාට අපි මේ රටේ මාධ්‍යවේදී රාජකාරිය අපිට පුළුවන් උපරිමයෙන් ජීවිත අවදානම ගැනවත් නොසිතා සිදු කරන ලද අය. පස්සෙ වෙලාවක ඇවිල්ලා හිමින් සීරුවේ කතන්දරේ අහගෙන ගිහිල්ලා රඟලා ලියනවා වෙනුවට අපි ඇහෙන් දැක්ක දේ ඔබට කියන්නම්.

අපි යද්දිත් බන්ධනාගාරය අසල එකම එක මිනිස් පොදියක්. ඒ මිනිස්සු මොකක්දෝ එකකට පොරකනවා. කෑගහනවා. මගේ පුතා, මගේ අයියා, මගේ මාමා, මගේ තාත්තා, මගේ බාප්පා, මගේ සහෝදරයා, මගේ යාළුවා, සමහරු නම් ගම් කියලා කෑගහනවා. අඩෝ මචං උඹ හොඳින්ද? උඹ ඉන්නවද? කියපන්, බලපන්, වරෙන්, පලයන්, බේරියන්, උන් උඹව මරයි. උන්ට ගහන්න ඕනේ, මරන්න ඕනේ කෑගහමින් සියලු දෙනා එක පොකුරට කෑගහනවා. එතැනට එන අය කවුද කින්ද මන්ද කොහෙන් ආපු අයද කියලා කවුරුත් බලන්නේ හොයන්නේ නැහැ. හැබැයි ඒ මිනිස්සුන්ට ඒ කෑගැහිල්ල, ඒ තැතිගැනිල්ල, ඒ වේදනාව, ඒ ඇඩිල්ල ඇර වෙන මොකක්වත් තිබුණේ නැහැ.

මට පුදුමයි ඒ මිනිස්සු ඔක්කොම එකතු නොවෙච්ච එක ගැන. ඒ මිනිස්සු ඔක්කොම එකතු වුණා නම් රැඳවියන්ට ඒ පැත්තෙ ඉඳන් දොර කඩන්න දෙයක් නෑ. මේ මිනිස්සුන්ටම මේ පැත්තෙ ඉඳන් දොර කඩන්න තිබුණා. රැඳවියන්ට වෙඩි තිබ්බට මේ මිනිස්සුන්ට වෙඩි තියන්න බෑ සහ වෙඩි තියන්නේ නෑ කියන විශ්වාසය මේ මිනිස්සු තුළ ගොඩනොනැගුණේ අතිශය වාසනාවකට. ඇත්තටම පළවෙනියෙන්ම බලධාරීන් අසමත් වුණේ මේ මිනිස් පොදිය එක තැනකට එකතු වෙන්න ඉඩ දුන්නු තැන. යම් හෙයකින් මේ මිනිස්සු එකතු වෙලා කවුරු හරි නායකත්වය දරලා මොකක් හරි දෙයක් කරන්න හිතුවා නම් මේ සිද්ධිය මීට වඩා අතිශය බරපතළ තත්ත්වයට පත්වෙන්න ඉඩ තිබුණා. මොකද ඔවුන්ට වෙඩි තැබීම කුමන මට්ටමකින්වත් සාධාරණීකරණය කරන්න බැරි වෙන නිසා.

අපි යන කොට සිද්ධිය බොහෝ වෙනස්. බන්ධනාගාරයේ ලී දොර ළඟ විශාල කලබලයක් තිබුණා. එස්.ටී.එෆ්. නිල ඇඳුම් සහිත නිලධාරීන් සිය ගණනක් එක පොදියකට පොරකමින් ඉන්නවා දැක්කා. දොර අසල කුමක් හෝ සිදුවෙනවා. දොර ඇරෙනවා, වැහෙනවා. සුදු කොට කලිසමක් ඇඳගත්තු පිරිමියෙක් එතැනින් එබිලා මොකක් හරි කිව්වා. ඒ කියනකොටම ඔහුට යකඩ බටයකින් හෝ ලී බටයකින් පහර දුන්නා එක්තරා නිලධාරියෙක්. ඔවුන් දොර වහගත්තා. ඉන් පස්සේ අපි දැක්කා දිගටම ඇතුළට බට දාලා අනිනවා, ගහනවා. සමහර වෙලාවට ඔවුන් දොර අරින්න උත්සාහ කරනවා, මේගොල්ලෝ ආයෙත් ගහනවා, ඒගොල්ලෝ ආයෙත් දොර අරින්න උත්සාහ කරනවා, මේගොල්ලෝ ගහනවා, මේ වගේ සිදුවීම් ටිකක් තිබ්බා.

කොහොම හරි අවසානෙට වෙන්නේ එක පාරටම බන්ධනාගාර නිලධාරියෙක් හෝ කුමන හෝ පුද්ගලයෙක්ගේ සිරුරක් දොරෙන් එළියට ඒම. ඒ




සිරුර අපි හිතන විදියට නිරුවතින් තිබුණා කියලා විශ්වාස කරන්න පුළුවන්. ඔහුව ඔසවාගත්තු නිලධාරීන් ගමන් කරනවා ඉස්සරහට. ඉන් පස්සේ ආයෙත් දොර වැහෙනවා. ඉන් පස්සේ බන්ධනාගාර නිල ඇඳුම් සහිත නිලධාරියෙක්, ඔහු හොඳින් හිටියා යැයි විශ්වාස කරන්න පුළුවන් මට්ටමක කෙනෙක්. ඔහු කවුද ඔහුට සිදුවුණේ මොකක්ද අපි දන්නේ නෑ. ඉන් පස්සේ දිගින් දිගටම මේ බන්ධනාගාර නිලධාරීන්ගේ සිරුරු එළියට ලැබෙනවා ඇතුළෙන්. එකකොට එළියේ ඉන්න අය කෑගහනවා.

මේ කලබලය අස්සේ... ඇතුළේ වෙඩි ශබ්ද හෝ කුමන හෝ ශබ්ද කීපයක් ඇහෙනවා. ඒ ශබ්ද ගැන නිශ්චිතව කියන්න අදහසක් නෑ. ඒක ඇතුළෙන් ඇහුණා යැයි අපි විශ්වාස කරන්නේ. ඇතුළේ විශාල කලබලයක් කාලගෝට්ටියක්. එළියෙත් විශාල කලබලයක් කාලගෝට්ටියක්. කිසිවෙකුට ළංවෙන්න යන්න එන්න යකඩ දොරෙන් ඇතුළට යන්න අවස්ථාවක් නෑ. මේ විදියට ඇම්බියුලන්ස් ඇවිල්ලා ඔවුන් අර බන්ධනාගාර නිලධාරීන් රැගෙන ගියා. ඔවුන් රැගෙන යන්න අර ලී දොර ගාවටම වාහන ගැනීමක් සිද්ධ වුණේ නැහැ.

ඒත් එක්කම අපි දකිනවා පළවෙනි දොර ඇරපු අවස්ථාවේදී එක්තරා නිලධාරියෙක් උඩින් කමිසයක් දාපු එක්කෙනෙක් අපි විශ්වාස කරන විදියට ඔහු කියන්නේ කලබල කරන්න එපා අපි ඒගොල්ලොත් එක්ක කතා කරමු වගේ දෙයක්. නමුත් ඒ අරින හැම වෙලාවෙම පහර දෙනවා ඇතුළේ ඉන්න අයට. ඒ නිසා සාමකාමී පරිසරයක් එතැන ආයෙත් නිර්මාණය වෙන්නේ නෑ. ඉන් පසුව තමයි අපි දකින නිලධාරියෙක් ඇවිල්ලා දොරේ කුඩා සිදුරෙන් ඇතුළට තුවක්කුව දාලා වෙඩි තියෙනවා. ඔහු එය කිහිප වතාවක් කරනවා. ඔහුට කවුරුත් සහාය දෙන්නේ නැහැ. ඒත් එක්කම තමයි දොර ඇරගන්න පුළුවන් වෙන්නේ. දොර ඇරගෙන එස්.ටී.එෆ්. නිලධාරීන් ඇතුළට යනවා.

අපි පසුව දැක්කා එහිදී දිව්‍යන රූප කීපයක්. ඒ රූප අතර එක්තරා රූපයක් විශේෂයෙන් මේ මොහොතේ සමාජ මාධ්‍ය ඇතුළෙත් කතා වෙනවා. ඒ රූප අපි නැවත නැවත විශ්ලේෂණය කරලා බලද්දී අපිට පේනවා මෙන්න මේ ආකාරයට. එහි ඉන්නවා සුදු බැනියමක් ඇඳලා සුදු පාට ලේන්සුවක් ගැටගහගත්තු කෙනෙක්. ඔහුගේ එක අතක කළු පාට බටයක් වැනි යමක් තියෙනවා පේනවා. ඒ වගේම ඔහුගේ දකුණු අතේ යම් මිටක ස්වරූපයක් පේනවා. ඔහු අතේ තමයි මේ හිතන්නේ ඒ දෙකම තියෙන්නේ. ඔහු දිවගෙන යනවා. ඔහු ඉදිරියෙන් යනවා කොළ පාට කලිසමක් සහ කළු පාට හුරු ටීෂර්ට් එකක් ඇඳගත්තු කෙනෙක්. මේ යන්නේ අපි විශ්වාස කරන විදියට තුවක්කු රැගෙන යැයි සමාජ මාධ්‍යවල සඳහන් වෙලා තියෙනවා. ඉතින් ඒ වීඩියෝ පසුව විශ්ලේෂණය කරලා බලද්දී අපිටත් පේන්න ගත්තා ඒ තුවක්කු විය හැකි බව. අපි දන්නේ නැහැ බන්ධනාගාර නිලධාරීන් අතේ තිබුණු තුවක්කු ඔවුන් ගත්තාද? මොකක් වුණාද කියලා. හරි තුකක් සහිත නිලධාරියා ඇතුළට කණ්ඩායම එළියේ ඉද්දී එස්.ටී.එෆ්. නිලධාරීන් ඇතුළට ගමන් කරනවා. ඒත් එක්කම වෙඩි සද්ද ඇහෙනවා.

නිල් පාට කලිසමක් සහ ගුරු පාට කමිසයක් සහිත පුද්ගලයෙක් දොර අසලදීම වැටෙනවා අපිට පේනවා. ඉතින් මේ වෙඩිතැබීම් මේ දේවල් සියල්ල එකම නාට්‍යයක් බවට පත්වෙද්දී මුළු පැත්ත පළාතම හෙල්ලෙන්න මහා හඬින් මේ වටේ ඉන්න ඥාතීන් කෑගහන්න පටන් අරගන්නවා. ඔවුන් කියනවා මගේ පුතා, මගේ තාත්තා අනේ වෙඩි තියන්න එපා සර්, වඳින්නම්, අයියෝ එපා කියලා. නමුත් ඒ සියල්ලම ව්‍යර්ථ වෙනවා. නමුත් ප්‍රශ්නය තියෙන්නේ අපිට පේන්නේ නැහැ මේ නිලධාරීන් එකවර එකට තුළට ගමන් කරන ආකාරයක්. අපිට බන්ධනාගාර සැකැස්ම ගැන අවබෝධයක් නැහැ. බන්ධනාගාර සැකැස්ම නිසා ඔවුන්ට එකවර ඇතුළට යන්න බැරිද කියන්න අපිට තේරෙන්නේ නැහැ. නමුත් ඔවුන් ඇතුළට යන්නේ නැහැ. ඔවුන් මේ දොර ආසන්නයේ රැඳී සිටිමින් වටේට වෙඩි තියනවා පේනවා. ඉන් පසුව 1990 ඇම්බියුලන්ස් එකක් ඇතුළු ඇම්බියුලන්ස් කීපයක් මේ ස්ථානයට එනවා. ඊට කලින් ලොරියක කුමන හෝ පිරිසක් පටවාගෙන යනවා ශ්‍රී ලංකා බන්ධනාගාරය කියලා සඳහන් කරපු. අර ඇම්බියුලන්ස්වලට මේ පුද්ගලයන්ව ගෙනල්ලා පටවනවා. සමහරු මියගිහිල්ලා කියන එක තේරෙනවා උස්සගෙන එන විදියෙන්ම. සමහරු හොඳින් එනවා, සමහරු ලේ වැගිරෙමින් එනවා, සමහරු කොට කලිසම් පිටින් එනවා. මේ ඔක්කොම දාගත්තු ඇම්බියුලන්ස් රථ එකින් එක ඉගිළෙන්න පටන් අරගන්නවා. මුළු මීගමුව නගරය දෙදරවමින් මේ සිදුවීම සිද්ධ වෙනවා.

මේ වෙද්දී දවස තරුණයි, දහවල උදාවෙලා. සියල්ල සිද්ධ වෙන්න ගතවෙලා තියෙන්නේ හෝරා කීපයක් විතරයි. ඒ වෙනකොටම ආරංචි වෙන්න පටන් අරගන්නවා මැරිලා කියලා පුද්ගලයන්. මැරිලලු, මරලලු, ඇතුළේදී මරලලු, වෙඩි තියලා මැරුවේ, ඔවුන් වෙඩි තිබ්බේ මුහුණු බලන්නේ නැතුව, වෙඩි තිබ්බේ හොයන්නේ නැතුව, වෙඩි තිබ්බේ ඉලක්ක කරලා කියන එක ඥාතීන් අතර කියැවෙන්න ගන්නවා. මීට අමතරව ඥාතීන් අතර ඇහුණු කතා බොහොමයක් තියෙනවා. කන්න දුන්නේ නැහැ, බොන්නවත් වතුර ටිකක් ඕකේ හරියට නැහැ. යන්න ටොයිලට් එකක් නැහැ, හැමෝටම ලෙඩ, ඩෙංගු හැදිලාලු, මිනිස්සු මාර පීඩනයක් විඳින්නේ, මිනිස්සු පව්. ඇයි මිනිස්සුන්ට මෙහෙම කරන්නේ, කාලකණ්ණි තොපිට හෙණ ගහනවා... මේ වගේ විවිධ වචන මේක ඇතුළේ ඇහෙනවා.

ඉතින් අපිට තියෙන එක්තරා ප්‍රශ්නයක් වෙන්නේ මේ විදියට මේ පුද්ගලයන්ට තිබුණු පීඩනය එළියට එන්නේ එකවරම. එහෙම නැතුව පීඩනය ගැන කිසිවෙක් කිසි තැනක කතා කළ බවක් සඳහන් වෙන්නේ නැහැ. දැන් බන්ධනාගාරය තුළ තියෙන මේ පීඩනය එළියට නොඇදී ඉන්න එකෙන් වෙන්නේ මේක පුපුරනකල්ම ඉවසගෙන හිටපු බව අපිට මේක ඇතුළේ ඇවිදිද්දී බලද්දී තේරිච්ච එකක්.

මේ කාරණය බන්ධනාගාරය තුළ ඉන්න රැඳවියන් විසින් කුමන හෝ විදියකට තමන්ගේ ඥාතීන්ට කියලා තියෙනවා. ඒ නිසා තමයි ඔවුන් මේක කියන්නේ. මොකද ඔවුන්ට ඒ වෙනකොටත් බන්ධනාගාර රැඳවියන් මුණගැහිලා නැහැ. රැඳවියන් සහ ඔවුන් අතර කතාබහ ඇති වෙලා නැහැ. ඔවුන්ට හොයාගන්න බැරිව යාම තමයි එතැන තියෙන ප්‍රශ්නය.

මේ පුද්ගලයන් අතර කියැවුණු කාරණය වෙන්නේ මේක ඊයේ රෑ ඉවර වුණා, ඇයි මේක උදේට අරගෙන ආවේ කියලා. ඉතින් අපි උත්සාහ කළා හොයලා බලන්න මේ දෙවැනි සිදුවීම මොකක්ද කියලා. පළමු සිදුවීම සුරේෂ් විසින් තමන්ගේ තොරතුරු ලබාදුන්නු පුද්ගලයෙක්ට සිද්ධ කරපු පහරදීම බව අපිට දැනගන්න ලැබුණා. මේ යට තියෙන කතාව මීට වඩා හරිම සංකීර්ණයි. ඒ කතාවෙ තොරතුරු භාගයක් දැනගෙන ඔබට කියන්න බැහැ. ඒ සියල්ලම කියැවෙන්නේ මේ ඥාතීන් අතර. එහෙම නැතුව මේ කිසිවක් කියැවෙන්නේ නැහැ විශේෂ නිලධාරීන් හෝ කවුරුත් හෝ අතර. ඉතින් අපි ඒ කතාව අහගෙන ඉද්දී අපට දැනගන්න ලැබුණා. ඒ වෙද්දි රෝහල අසල ඇතිවෙලා තියෙන කලබලය ගැන. අපි රෝහල අසලට යද්දී රෝහල අසල එකම එක කාලගෝට්ටියක් බවට පත්වෙලා තිබුණා.

මේ ලිපිය ලියන ලියුම්කරු විසින් පැහැදිලි කරන්න තියෙන කාරණා ටිකක් ඔබට පැහැදිලි කරන්නම්. මේ සිදුවීම පළමුවැනි දවසේ සිද්ධ වෙලා යම් සමථයකට පත්වෙලා යම් ගැටලුවක් අළු යට ගිනිපුපුරු වගේ තිබුණු තැනකට පිටස්තර නිලධාරීන් පිරිසක් යවලා ඔවුන්ගේ ජීවිත අවදානමේ දැම්මාද කියලා ලොකු චෝදනාවක් තියෙනවා. ඒක පාර්ලිමේන්තුවේදිත් කියැවුණා. ඒ වගේම ඔවුන් බන්ධනාගාරය තුළට ගිහිල්ලා යම් ගැටුමක් ඇති කරගත්තා නම් ඒක කොච්චර අමනෝඥ ක්‍රියාවක්ද කියන එකත් අපිට හිතෙනවා.

අපි මේ කියන්නේ අපිට දන්න තරමට සහ තේරෙන තරමට, අපි දැකපු අහපු තොරතුරුවල ප්‍රමාණවත් කරුණු ටිකක් නිශ්චය කරලා විතරයි. මේ තුළ සිද්ධ වෙච්ච බොහෝ දේ තවමත් කිසිවෙක් දන්නේ නැහැ. මේ පහරදීම්, මේ තැළුණු මුහුණු, මේ බරපතළ තුවාල සිදුවීම් ගැන අපිට අපැහැදිලියි. ඇතැම් නිලධාරීන්ගේ මුහුණේ වෙඩිවැදුණු ස්වරූපයක් පෙනෙන්නේ කොහොමද කියලා අපිට තේරෙන්නේ නැහැ. ඒ සම්බන්ධව සමාජ මාධ්‍යවල තියෙන කාරණා ලියන්න අපිට බැහැ. අපිට අවශ්‍ය වෙන්නේ සත්‍ය තොරතුරු.

වෙඩිතැබීම සිද්ධ වෙලා තියෙන්නේ ඉලක්ක කරලා කියන එක ඇතැම් මෘත ශරීර දකිද්දී අපිට හිතෙනවා. නමුත් ඒක අහම්බයක් ලෙස සිද්ධ වෙන්නත් බැරි නැහැ. කොහොම වුණත් දහවල් වෙනතුරු කිසිම නිශ්චිත තොරතුරක් බන්ධනාගාර රැඳවියන් පිළිබඳ මේ දහස් ගණනක් පොරකමින් ඉන්න මිනිස්සුන්ට ලබාදෙන්න කිසිම බලධාරියෙක් සමත් වුණේ නැහැ. ඔවුන් එක වෙලාවකදී රෝහල්ගත කරන පුද්ගලයන්ගේ නාමලේඛනයක් මීගමුවේ රෝහල ඉදිරිපිට අලවලා තිබුණා. එහි රතු පෑනෙන් ලියලා තිබුණා මේ ඉන්න අය බලන්න එන්න නම් බන්ධනාගාර ප්‍රධානියාගේ ලියුමක් අවශ්‍යයි කියලා. එහි නම් 34ක් වගේ ප්‍රමාණයක් තමයි මුලින් තිබ්බේ. පසුව ඒක දීර්ඝ කරලා තිබුණා.

ඒ වගේම රෝහල ඉදිරිපසත් විශාල කලබලයක් නිර්මාණය වුණා. මේ කලබලය සෑහෙන වෙලාවක් යනකොට ඉතාම වෙනස් ස්වරූපයක් ගත්තා. නමුත් ඔවුනුත් අර දොර කඩාගෙන ඇතුළට යන්න නෙමෙයි උත්සාහ කළේ. ඔවුන් උත්සාහ කළේ අවසර අරගෙන කතාබහ කරලා ඇතුළට යන්න ඉඩ දෙන්න කියලා ඉල්ලලා ඇතුළට යන්න. නමුත් ඒකට අවසර ලැබුණේ හවස පහත් පහුවුණාට පස්සේ දසදෙනා බැගින් ඇතුළට ගැනීමේ ක්‍රමයක් පොලිසිය මගින් හඳුන්වා දුන්නා. ඒ වෙද්දී ප්‍රශ්නය ඔඩුදුවලා දරුණු අතට හැරිලා තිබුණා. මේ රෝහලට එන අත්‍යාවශ්‍ය ඩෙංගු රෝගීන්ගේ ඥාතීන්ට පවා රෝහලට ඇතුළු වීමට අවස්ථාව ලබා නොදෙන්න තීරණය කිරීමත් එක්ක. ඒ අනුව මේක තවත් උණුසුම් අතට හැරෙන්න නියමිතව තිබුණා.

මේ බන්ධනාගාරය තුළ ඇහුණු වෙඩි තැබීම් හඬ සහ යම් කාලයක් ගතවෙලා, මේ සියල්ල සිද්ධ වුණාට පස්සෙත් වෙඩිතැබීම් හඬවල් කීපයක් ඇහුණු බව ඇතැම් ඥාතීන් විසින් කියන්න පටන් අරගත්තා. මේ ඥාතීන්ගේ කලබලය නිවා දමන්නට කිසිම බලධාරියෙක් නිශ්චිත උත්සාහයක් දරපු බවක් අපි දැක්කේ නැහැ. මේ අසමර්ථකම තමයි අපි දුටු නරකම සහ භයානකම තත්ත්වය. මොකද බන්ධනාගාරයෙන් තමන්ගේ ඥාතියා ඉන්නේ කොතැනද කියලා දැනගන්නයි මිනිස්සු ඇවිල්ලා හිටියේ. නැතුව ඒ මිනිස්සු ඇවිල්ලා හිටියේ කෑකෝ ගහන්නවත් රණ්ඩු වෙන්නවත් ගහගන්නවත් නෙමෙයි. හැබැයි බලධාරීන් තවමත්, මේ ලිපිය ලියන මොහොත වනතුරුත් එවැනි උත්සාහයක් සාර්ථකව සිද්ධ කරලා නැහැ. බන්ධනාගාරය තුළ සිදුකරන පාලනය කොයි තරම් අසාර්ථකද කියලා එල්ල වන චෝදනා, ඒ වගේම බන්ධනාගාරය කොච්චර නරක විදියට පාලනය කරනවා ඇතිද කියලා එල්ල වන චෝදනා අපිට පැහැදිලි වෙන්නේ මේ සිදුවීමේ අපි දැකපු දේවලුත් එක්ක. මොකද ඒකට හේතුව තමයි මේ මිනිස්සුන්ව බස්වල දාලා තැනින් තැනට යැව්වාට කාව යැව්වාද කොහේට යැව්වාද කොහොම යැව්වාද කියන තොරතුර තිබුණේ නැහැ.

හැම මනුස්සයෙක්ම ඇවිල්ලා කිව්වේ තමන්ගේ පුතාගේ දුවගේ නම. මගේ පුතා මෙන්න මෙයා. මගේ දරුවා මෙන්න මෙයා. මගේ ඥාතියා මෙන්න මෙයා. එයා දැන් කොහේද? එයා දැන් ඉන්නේ කොයි බන්ධනාගාරයේද? එයාට තුවාල වෙලාද? එයා මරලා දාලාද? එයාට මොකක්ද වෙලා තියෙන්නේ? මේ කිසිම දෙයක් සම්බන්ධව තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් තොරතුරු ලබාගත්තා ඇර නිවැරදි තොරතුරක් දෙන්න මේ කිසිවෙක් සමත් වුණේ නැහැ. බොහෝ වෙලාවට සිද්ධ වුණේ සංදර්ශන විතරයි.

ලියුම්කරුවෙක් විදියට ඇසින් දුටු සාක්ෂි අනුව කියන කාරණයක් වෙන්නේ සමහර සිදුවීම් මීට වඩා පහළ තැනකදී නිමා කරගන්න තිබුණා කියන එක. සමහර දේවල් මෙච්චර දරුණු අතට නොහැරෙන්න ඉඩ තිබුණා කියන එක. සමහර පුද්ගලයන්ව මේ විදියට නොමැරී ජීවත් කරවා ගන්න තිබුණා කියන එක. රාත්‍රියේ දෙදෙනෙක් මියගියාට පස්සේ මේ සිද්ධියට සම්බන්ධයි සැක කරන පාර්ශ්ව දෙක එකිනෙකාගෙන් අයින් කරලා බන්ධනාගාරයෙන් එළියට අරගෙන ගියා නම් මේ සිද්ධිය සමහර විට ඒ රාත්‍රියේදීම නිමා වෙන්නත් තිබුණා.

ඒ වගේම පසු දින උදෑසන වෙනත් බන්ධනාගාර නිලධාරීන් මේ ස්ථානයට නොගිහින් හිටියා නම් සහ මේ ස්ථානයට ගිය බන්ධනාගාර නිලධාරීන් බන්ධනාගාරය ගැන හොඳට දන්නා අය වුණා නම් සහ බන්ධනාගාර නිලධාරීන් විසින් මේ තත්ත්වය පාලනය කිරීම සම්බන්ධව පියවරක් අරගත්තා නම් මේ මරණ දෙකෙන් එහාට නොයන්න තිබුණා. බන්ධනාගාර නිලධාරීන් හත්දෙනාගේ මරණවලට බොහෝ අය වගකිව යුතුයි. ඒ අය මේ 2600කට ආසන්න ප්‍රමාණයක් දඬුවම් විඳිමින් ඉන්න, වැරදිකරුවන් ඉන්න, වැරදි කළ බවට සැක කරන අය ඉන්න ස්ථානයකට නිරාවරණය කරන්නේ කුමන කාරණාවක් මතද කියලා අපිට ප්‍රශ්නයක්.

පසුව හෙලිකොප්ටර් යානා දාලා ඇතුළේ සිද්ධ වෙන්නේ මොකක්ද කියලා නිරීක්ෂණය කරලා වැඩක් නැහැ. අස්සයා පැනලා ගියාට පස්සේ ඉස්තාලේ වහන සුපුරුදු ශ්‍රී ලාංකික පුරුද්ද තමයි අපි මේ වතාවෙත් දැක්කේ.

රෝහල ඉදිරිපස සිදුවීම ගැන ඔබට කියන්නම්. හවස තුන, තුනහමාර, හතර වෙනකොට රෝහල ඉදිරිපිට සම්පූර්ණයෙන්ම මහා ජනතාවගෙන් පිරී ඉතිරී යනවා. ඒ අය කෑගහන්න ගන්නවා. ඉල්ලන්න ගන්නවා. නමුත් හවස පහ පහහමාර වෙනකොට වේගයෙන් එන රථ පෙළක් ඇතුළු වෙනවා රෝහලට. ඒ රථ පෙළේ එන්නේ අමාත්‍යවරයා බව සඳහන් කරනවා. ඉන් පසුව තමයි දසදෙනා බැගින් රෝහල තුළට ගන්න මේගොල්ලෝ තීරණය කරන්නේ. රෝහලේ ඒ වෙනකොටත් මෘත ශරීර විසිහයක් තබා තිබෙන බව දැනගන්න ලැබෙනවා. බන්ධනාගාර නිලධාරීන් හත්දෙනාම මියගිහිල්ලා. ඉන් හයදෙනෙක් තමයි දහවල් කාලය වෙනවිට මියගොස් තිබුණේ. එක් අයෙක් මියයන්නේ රෝහලට ගෙනාවට පස්සේ.

බොහෝ රැඳවියන් රෝහලට ගෙනෙද්දීත් මියගොස් අවසානයි. ඔවුන් බරපතළ ලෙස තුවාල වෙලා මියගිහිල්ලා තිබුණු අය බව පැහැදිලිව පේනවා. බන්ධනාගාරයේ පහරදීම්වලින් මියයනවා කලින් දවසේ දෙදෙනෙක්. අනිත් අය පහරදීමෙන් මියගිය බවට පෙනෙන මෘත ශරීර නොවෙයි. අපි දන්නේ නැහැ ඔවුන්ට පහර දුන්නාද, ඔවුන් මියගියාද කියලා. අපි මේ කියන්නේ ඇසින් දුටු සහ මේ ස්ථානයේ සිට දැනගත්ත කාරණාව.

කොහොම නමුත් රාත්‍රිය වනකොටත් බන්ධනාගාරය අසල මහ ජනතාව රැඳී ඉන්නවා. නමුත් මහ රෑ වෙනතුරුත් නිවැරදි තොරතුරක් ලබාදෙන්න මේ නිලධාරීන් අසමත් වෙනවා. ඒ වගේම රෝහල තුළ ඉන්න බලධාරීන් බරපතළ ප්‍රශ්නයකට මුහුණ දුන් බව අපිට පැහැදිලියි. මොකද ඇත්තටම රෝහල තියෙන්නේ ඩෙංගු අධිඅවදානම් තත්ත්වයක. එවැනි තත්ත්වයකදී මෙවැනි ප්‍රශ්නයකට ඔවුන්ට උත්තර හොයන්න සිදුවීම හරිම නරකයි.



ජීවන පහන් තිළිණ




# අමරේ මම මහින්ද.. ඔය වැඩේ නවත්තපං....

## එහෙම කිව්වේ නැත්නම් මළා ජෝන් තමයි...

**මීගමුව බන්ධනාගාරය තුළ සිදුවූ ඝාතන පිළිබඳ පාර්ලිමේන්තුවේදී අදහස් දක්වමින් නියෝජ්‍ය අමාත්‍ය මහින්ද ජයසිංහ මහතා එවකදී තංගල්ල බන්ධනාගාරයේ සිදුවූ සිදුවීමක්ද සිහිපත් කරමින් රාජපක්ෂවරුන්ට චෝදනාවක් එල්ල කළේය. ඒ, මහින්ද රාජපක්ෂ දකුණේ පාතාල නායකයකු වූ ජුලම්පිටියේ අමරේ සමග සබඳතා පැවැත්වූ බව කියමිනි.නමුත් එහි ඇත්ත කතාව මීට හාත්පසින්ම වෙනස්ය. පහත පළවන්නේ බේදවාචකයකින් අවසන් වීමට ගිය තංගල්ල බන්ධනාගාරයේ සිද්ධිය සාමකාමීව විසඳා ගැනීමට මහින්ද රාජපක්ෂ ක්‍රියා කළ ඇත්ත කතාවයි.**

ඉතිහාසය මතක අය ඒක නොදන්න කතාවක් නෙවෙයි. අමුතුවෙන් මතක් කරන්න ඕනෙ නෑ. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා දැනට වසර විසි ගණනකට පෙර විපක්ෂ නායකවරයාව සිටියදී තංගල්ල බන්ධනාගාරයේ ඇති වූ සිරකරුවන්ගේ කැරැල්ලක බිහිසුණු තත්ත්වයක් සමනය කිරීම සඳහා දුන් දායකත්වය සහ ඉදිරිපත් වීම පිළිබඳ උපහාසාත්මක සහ විවේචනාත්මක අදහස් පළකරනු දකින්නට ලැබුණා. නමුත් එදා ඒ මැදිහත්වීම තුළින් සිදුවූ යහපත කිසිසේත් අවතක්සේරු කළ හැකි එකක් නෙවෙයි. එදා සිරකරුවන් තංගල්ල බන්ධනාගාරයේ පාලනය තමන් අතට ගෙන පැය විසි හතරකටත් වැඩි කාලයක් ගොස් තිබුණා. බන්ධනාගාර නිලධාරීන්ට සහ ආරක්ෂක අංශවලට ඒ වනවිටත් එයට ඇතුළු වී ඒ බිහිසුණු අසීරු තත්ත්වය පාලනය කරගැනීමේ හැකියාවක් තිබුණේ නෑ. සිරකරුවන් හාරසීයක් පමණ එක්වී බන්ධනාගාර නිලධාරීන් දහදෙනකු ප්‍රාණ ඇපකරුවන් ලෙස රඳවාගෙන තිබුණා. සමහර විට එය දුරදිග ගියා නම් මීගමුවේ සිදුවූ මහා විනාශය වැනි දෙයක් වන්නට තිබුණා. ඒ වනවිට බන්ධනාගාර අමාත්‍යාංශය භාරව සිටියේ ජෝන් අමරතුංග අමාත්‍යවරයා. ඔහුගේ දේශපාලනය අප කිසිසේත් අනුමත කරන හෝ අගය කරන එකක් නෙවෙයි. විශේෂයෙන්ම මිලේනියම් සිටි ආරක්ෂක නිවාසය සම්බන්ධ කටයුත්තේදී ඔහුගේ ක්‍රියා කලාපය හරිම අප්‍රසන්නයි, නින්දිතයි යන අදහස හැමදා අපේ සිත් තුළ තිබෙනවා. නමුත් මේ සිද්ධියේදී ඔහු ඊට වඩා දූරදර්ශීව කටයුතු කළා.

ඒ අරගලයේ නායකත්වය දී තිබුණේ තංගල්ල බන්ධනාගාරයේ සිටි, තංගල්ල ප්‍රදේශයේම පුද්ගලයෙක්. ඔහු ජුලම්පිටියේ අමරේ නමැති මැරවර නායකයෙක්.

මහින්ද රාජපක්ෂ මහතාගේ දීර්ඝකාලීන හම්බන්තොට දිස්ත්‍රික්කයේ දේශපාලනයේදී විවිධ පුද්ගලයන් ඔහුට මුණගැහෙනවා. එමෙන්ම ඔහු හම්බන්තොට දිස්ත්‍රික්කය පුරා උසාවිවල නීතිඥයකු ලෙස කටයුතු කර තිබුණා. පක්ෂ විපක්ෂ බොහෝ දෙනාගේ ඔහු කෙරෙහි විශ්වාසයක් ගෞරවයක් තිබුණා. විශේෂයෙන්ම 88-89 භීෂණ යුගයේ රජයෙන් සහ රජයට සහාය දැක්වූ නිල නොවන පැරා මිලටරි කණ්ඩායම් විසින් අත්අඩංගුවට ගන්නා ලද සහ පැහැරගන්නා ලද තරුණයන්ගේ ජීවිත බේරාදීමට ඔහු කළ මෙහෙය නිසා, ඔහුට ගරුකරන ආදරය කරන විශාල පිරිසක් හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ සිටියා.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ බොහෝ පවුල්වල කවර හෝ ඥාතියකුට එවැනි ඉරණමකට කරදරයකට මුහුණ දීමට සිදුවී තිබුණු බව සියල්ලන්ම දන්නා දෙයක්. එම යුගයේ දෙපැත්තකින් එල්ල වන මරණ තර්ජන නිසා එම භීෂණයට එරෙහිව නැගී සිටීමට දේශපාලනඥයන් පසුබට වූ යුගයක මහින්ද රාජපක්ෂ පෙරට විත් කළ මෙහෙය එකල මිනිසුන්ගේ හදවත් තුළ ඉහළින්ම රැඳී තිබුණා. ඒ නිසා මේ හම්බන්තොට බන්ධනාගාරයේ සිදුවූ කැරැල්ල මැඩපැවැත්වීමට අදාළ අමාත්‍ය ජෝන් අමරතුංග, මහින්ද රාජපක්ෂ මහතාගේ ද සහාය ඉල්ලා සිටියා.

තමන්ට විසඳා ගැනීමට අපහසු විනාශකාරී තත්ත්වයක් විසඳා ගැනීම සඳහා විපක්ෂයේ සිටි මහින්ද රාජපක්ෂගේ සහාය ඉල්ලීමට ඔහු නිහතමානී වීම, අපට කිසිසේත් නොගැළපුණු අදහස් ඇති පුද්ගලයෙකු වුවත් එදා ජෝන් අමරතුංගගේ ක්‍රියාව අගය කළ යුතුයි. එමෙන්ම සාම්ප්‍රදායික විපක්ෂයක් සාමාන්‍යයෙන් කටයුතු කරන්නේ රජය අපහසුතාවට පත්වන අවස්ථාවලදී ඒ තුළින් වාසියක් ලබාගැනීමයි. නමුත් මහින්ද රාජපක්ෂ එදා එසේ කළේ නැහැ. ඔහු ජෝන් අමරතුංග ඇමැතිවරයා සමග බන්ධනාගාරයට ගියා. පැත්තක යන ලෙඩක් නිකම් ඇගේ දාගන්නේ නැතුව ඔහුට නිහඬව සිටීමට ඕනෑ තරම් ඉඩ තිබුණා. ඔහුට වගකීමක් තිබුණේ නෑ. ඒ ඔහු පාලන බලයේ සිටි කාලයක් නෙවෙයි. විපක්ෂයේ සිටි කාලය.

ඔහු දේශපාලන පක්ෂ භේදයකින් තොරව ඒ කටයුත්තට සහාය දී කැරලි නායකයාට කතා කළා. ඒක ඒ කාලයේ ප්‍රසිද්ධ කතාවක්. 'අමරේ මේ මම මහින්ද රාජපක්ෂ කතා කරන්නේ. ඔය වැඩේ නවත්තපන්.... උඹලටත් ප්‍රශ්නයක් නොවෙන විදියට කතා කරලා මේක බේරගන්න පුළුවන් එකක්... ඒ නිසා නිලධාරීන්ට යටත් වෙලා කතා කරපන්... මම කියන වචනේ විශ්වාස කරපන්..' යනුවෙන් පැවැසූ පසු කැරලි නායකයන් එයට අවනත වී කැරැල්ල අතහැර දැමුවා. විශාල හානියක් සිදුවන්නට ගිය ඒ අවස්ථාව කළමනාකරණය කරගැනීම සඳහා එදා ඔහු දුන් සහාය එකල සියලු දෙනාගේ ඇගයීමට ලක්වුණා. විශාල ජීවිත විනාශයකින් කෙළවර වන්නට තිබූ අවස්ථාවක් එලෙස විසඳීමට සහාය වීම වරදක්ද...?

ප්‍රශ්නයක් ඇතිවන අවස්ථාවලදී එතැනට නොගොස් සැඟවෙන සමහරුන්, ප්‍රශ්නය සමනය වූ විට ඉදිරියට ඇවිත් වීරයන් මෙන් කතා පවත්වනවා. ඒවා නිකම්ම නිකන් පුස් කතා. එහෙමත් නැත්නම් පොර ටෝක්ස්.

නායකත්වයක අගය දැනෙන්නේ අර්බුදකාරී අවස්ථාවකදී මිසක් සාමකාමී පරිසරයකදී නෙවෙයි. අදටත් අන්තර්ජාලයට ගොස් විමසා බැලූ විට එහි ඒ සිදුවීම පිළිබඳ සඳහන් වෙනවා දැකගත හැකියි.

එහි ඇති එක් ඡයාරූපයක ඇත්තේ එවන් සටහනක්.

ගල්පිළිම සහ බොල්පිළිම වෙන්කර හඳුනා ගැනීමට පුළුවන් මිනිසුන් මෙන්ම, නොහැකි මිනිසුන්ද සිටින නිසා මේ අදහස්වලට එල්ල කරන විවේචන මම ගණන් ගන්නේ නෑ.

*ලාල් ද අල්විස්*

ගිය සතියෙන්

# රටින් පැන්න පාතාලේ

## අවසාන කොටස

**මෙරටින් පලාගොස් සිටින පාතාල නායකයන්ගේ නම් ලැයිස්තුවක් සහිත ලිපියක් පසුගිය සතියේ 'මව්රට' පුවත්පතේ පළකිරීමට අප පියවර ගත්තෙමු. මේ පළවන්නේ එම ලිපියේ අවසන් කොටසය.**

### 20. පූකුඩිකන්නා



බාලචන්ද්‍රන් පුෂ්පරාජ් හෙවත් පූකුඩිකන්නා මට්ටක්කුලිය ආශ්‍රිතව මත්කුඩු ජාවාරමේ නිරතව සිටියෙකි. පාතාල අපරාධවලටද සම්බන්ධව සිටි ඔහු දැන් ඉන්නේ ඉන්දියාවේය. කිඹුලාඇල ගුණාගේ මත්කුඩු ජාලයට සම්බන්ධ පූකුඩිකන්නා ද මේ වනවිට සිටින්නේ ඉන්දියානු ආරක්ෂක අංශ අධීක්ෂණයේය. ඔහුව ඉන්දියානු ආරක්ෂක අංශ අත්අඩංගුවට ගන්නේ කේරළයේදීය.

### 21.කුඩු අස්මින්

මොහොමඩ් මන්සූර් මොහොමඩ් අස්මින් මට්ටක්කුලිය කේන්ද්‍ර කරගෙන මහාපරිමාණ කුඩු ජාවාරමට සම්බන්ධව සිටි අයෙකි. මත්කුඩු ජාවාරම හේතුවෙන් ඔහුට ජීවිතාන්තය දක්වාම සිර දඬුවම් හිමිව ඇත. සිරදඬුවම ලැබෙන විට ඔහු බෝට්ටුවක නැගී ඉන්දියාවට පලාගොස් තිබුණි. ඉන්දියාවේ සිට ඔහු කිඹුලාඇල ගුණා සමග එක්ව කොළඹ කුඩු පාතාලය මෙහෙයවීය.

### 22. කෙසෙල්වත්තේ ධනුක



නල්ලපෙරුම තන්ත්‍රිගේ ධනුක රොෂාන් හෙවත් කෙසෙල්වත්තේ ධනුක කෙසෙල්වත්ත ආශ්‍රිතව ක්‍රියාත්මක වූ පාතාලයේ ප්‍රබලයෙකි. කප්පම් ගැනීම් මත්කුඩු ජාවාරම, ඇතුළු පාතාල අපරාධවල නිරතවූ ඔහු පාතාලයට අතපොත් තබන්නේ කෙසෙල්වත්තේ දිනුකගෙනි. ඩුබායිහිදී හෘදයාබාධයකින් දිනුක මියයාමෙන් පසු කෙසෙල්වත්තේ බලය ඉන්දියාවේ සිට ඇල්ලූ ධනුක ඉන්දියාවේදී කිඹුලාඇල ගුණා සමග මත්කුඩු ජාවාරමට සම්බන්ධව ඇත. කිඹුලාඇල ගුණා අත්අඩංගුවට ගැනීමත් සමග ඉන්දියානු මත්ද්‍රව්‍ය කාර්යාංශය දිනුකත් අත්අඩංගුවට ගත්තේය. තවමත් ඔහු එරට සිටින්නේ ඉන්දියානු ආරක්ෂක අංශ භාරයේය.

### 23. අතුරුගිරියේ ලඩියා

දීනමුල්ල කංකානම්ගේ නලින් චතුරංග නොහොත් අතුරුගිරියේ ලඩියා පාතාලයේ චරිතයක් ලෙස කුප්‍රකට වන්නේ 2017 වසරේදී කළුතර එතනමඩලේදී බන්ධනාගාර බස් රථයකට වෙඩිතැබීමේ සිදුවීමත් සමගිනි. එම සිදුවීමෙන් අනතුරුව අංගොඩ ලොක්කා සමග ඉන්දියාවේ තමිල්නාඩුවට බෝට්ටුවක නැගී පැනගන්නා ඔහු එරට රැඳීසිටින්නේ අංගොඩ ලොක්කා සමගිනි. කේරළ ප්‍රාන්තයේ වැඩි කාලයක් රැඳී සිට ඇත. අනතුරුව දෙදෙනා සමග ඇතිවූ යම් විරසිකභාවයකින් අනතුරුව බැංගලෝරයට ගොස් සිටි ඔහුව හසුවන්නේ ඉන්දියානු මත්ද්‍රව්‍ය කාර්යාංශයට 2021 වසරේදීය. තවමත් ඔහු සිටින්නේ ඉන්දියානු ආරක්ෂක අංශ අධීක්ෂණය යටතේය.

### 24. වැල්ලේ සුරංග

ගමගේ සුරංග ප්‍රදීප් හෙවත් වැල්ලේ සුරංග මෝදර සහ මට්ටක්කුලිය ප්‍රදේශ කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක වන සංවිධානාත්මක අපරාධකරුවෙකි. මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකි. 2020 වසරේ අගෝස්තු 23 වැනිදා ඔහු ගෝලබාලයන් 03 දෙනෙක් සමග ඩුබායි පැනීමට ගුවන්තොටුපළට පැමිණි අවස්ථාවේදී පොලිසිය අත්අඩංගුවට ගන්නේ මිනිස් ඝාතන සම්බන්ධයෙනි. අධිකරණයට ඉදිරිපත්කර රක්ෂිත බන්ධනාගාරගතව සිටි ඔහු ඇප ලැබීමෙන් අනතුරුව 2021 වසරේදී බෝට්ටුවක නැගී ඉන්දියාවට පැන්නේය. ඒ අධිකරණයෙන් ඔහුට විදෙස් ගමන් තහනමක් පනවා තිබියදීය. එහෙත් ඔහුට වැඩි කාලයක් එරට නිදහසේ රැඳී සිටීමට ඉඩක් නොවීය. ඉන්දියානු මත්ද්‍රව්‍ය කාර්යාංශයට තමිල්නාඩුවේදී කොටුවිය. තවමත් ඔහු සිටින්නේ ඉන්දියානු ආරක්ෂක අංශ භාරයේය.

### 25. ලලිත් කන්නන්ගර

හංවැල්ල සහ ඒ අවට කේන්ද්‍ර කරගෙන මත්කුඩු ජාවාරම ඇතුළු පාතාල ක්‍රියාකාරකම්වල නිරතව සිටින ලලිත් කන්නන්ගර කුප්‍රකට චරිතයක් බවට පත්වන්නේ කප්පම් නොදීම නිසා හංවැල්ලේ වෙළෙඳ ව්‍යාපාරිකයෙක් ඝාතනය කිරීමත් සමගිනි. 2022 වසරේදී ඔහු බූරු මූණා නමැති කුලී ඝාතකයා යොදා එම ඝාතනය කරවනු ලැබීය. 2022 වසරේ අග භාගයේදී පමණ රටින් පලාගිය ලලිත් කන්නන්ගර මේ වනවිට ඩුබායිහි රැඳී සිටී. රාජ්‍ය බුද්ධි සේවය සහ ජාත්‍යන්තර පොලිසිය විසින් කළ විශේෂ මෙහෙයුමක ප්‍රතිඵලයක් ලෙස ඔහු 2025 ඔක්තෝබර් මාසයේදී ඩුබායි පොලිසිය අත්අඩංගුවට ගත්තද මෙතෙක් ඔහුව මෙරටට භාරදුන්නේ නැත.

### 26. හඳපාන්ගොඩ හඳයා

තනූජ සම්පත් නොහොත් හඳපාන්ගොඩ හඳයා හෝමාගම, පාදුක්ක, වටරැක, මීගොඩ, ගොඩගම සහ අතුරුගිරිය කේන්ද්‍ර කරගනිමින් මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම් සහ සංවිධානාත්මක අපරාධ මෙහෙයවන ප්‍රධාන පෙළේ අපරාධකරුවෙකි.

2022 වසරේදී රටින් පලාගිය ඔහු පොලිස් විශේෂ කාර්ය බළකායේ විශේෂ මෙහෙයුම් භාර නිලධාරියකුට පවා ජීවිත තර්ජන එල්ලකරනු ලැබීය. ඊට අමතරව ඔහු හෝමාගම ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයාට පවා මරණ තර්ජන එල්ලකර තිබේ. ඩුබායිහි රැඳී සිටිමින් ඔහු අපරාධ සහ මත්කුඩු ජාවාරම මෙහෙයවන බව පොලිස් වාර්තාවල සඳහන්ය.

### 27. කොණ්ඩ රංජි



රංජිත් කුමාර නොහොත් කොණ්ඩ රංජි ප්‍රබල මත්කුඩු ජාවාරම්කරුවෙකි. කඳානේ පදිංචිකරුවෙක් වන ඔහු පාකිස්තාන් සහ ඉරාන මත්කුඩු ජාවාරම්කරුවන් සමග කිට්ටුවෙන් ඇසුරුකරන අයෙක් ලෙස හඳුනාගෙන ඇත.

ඩුබායිහි ඔහු රැඳී සිටින්නේ ගෝල්ඩන් වීසාවෙනි. ඔහුගේ වීසාව වසර 10ක් වලංගුය. මෙම වසරේ ජනවාරි මාසයේදී ඔහු සිය බිරිඳ හා දරුවන් සමග ඉතාලිය බලා පලායාමේ අපේක්ෂාවෙන් ඩුබායි ගුවන් තොටුපොළ වෙත ගිය අවස්ථාවේදී රතු නිවේදනයට අනුව ඩුබායි ආරක්ෂක අංශ විසින් අත්අඩංගුවට ගෙන තිබුණි. ඔහුව මෙරටට භාරදෙන ලෙස කොතෙකුත් ඉල්ලීම් කළද පසුගිය සතියේ ඔහුව ඩුබායි බලධාරීන් විසින් නිදහස්කර ඇත.

### 28. රසල් ස්මිත්

රසල් ඇලෝසියස් ස්මිත් නොහොත් රසල් ස්මිත් රත්මලාන සහ ගල්කිස්ස ප්‍රදේශ කේන්ද්‍ර කරගනිමින් සංවිධානාත්මක අපරාධ සහ මත්ද්‍රව්‍ය ජාවාරම් මෙහෙයවන අයෙකි. ගොනාකෝවිලේ අංජුගේ ගෝලයෙකි. ඔහුව සමාජය තුළ මතුවන්නේ 2023 වසරේ සිටය. ඔහු පොලිස් නිලධාරීන් පවා යොදා ගනිමින් මත්කුඩු ජාවාරමේ නිරතව සිටින්නෙකි. ඔහුගේ ජාවාරමට සම්බන්ධ පොලිස් නිලධාරියෙක් 2025 වසරේ ඔක්තෝබර් මාසයේදී බස්නාහිර පළාත් උතුරු දිසා අපරාධ කොට්ඨාසයට හසුවන්නේ ග්‍රෑම් 400ක හෙරොයින් සමගිනි. 2023 වසරේදී රටින් පලාගොස් ඩුබායිහි රැඳී සිටින ඔහුව ඩුබායි පොලිසිය වරක් අත්අඩංගුවට ගෙන නිදහස්කර තිබුණි.

### 29. බඩෝවිට අසංක

ගලබොඩ ලියනගේ අසංක ප්‍රදීප් කුමාර නොහොත්



බඩෝවිට අසංක මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවකු සහ සංවිධානාත්මක අපරාධකරුවකි. ඩුබායිහි සිටිමින් ඔහු මත්කුඩු ජාවාරම සහ පාතාල අපරාධ ක්‍රියාවල නිරත වේ.

වෙලේ සුදාගෙන් පසු බඩෝවිට කේන්ද්‍ර කරගනිමින් මත්කුඩු ජාවාරමට පිවිස ඇති අසංක 2021 වසරේ පොලිස් විශේෂ කාර්ය බළකායට මත්කුඩු සමග හසුවිය. ඊට ඇප ලැබීමෙන් අනතුරුව ඔහු රටින් පැන්නේය. දූෂිත පොලිස් නිලධාරීන්ගෙන් වැඩ ගන්නට ඔහු දක්ෂයෙක් බව කියයි. මොහුගේ ප්‍රධාන ප්‍රතිවාදියා කොස් මල්ලීය. ඔවුන් දෙපාර්ශ්වය අතර ඇති ගැටුමෙන් දෙහිවල සහ ගල්කිස්ස ආශ්‍රිතව සිදුව ඇති මරණ ගණන 10කට වැඩිය.

### 30. කොස් මල්ලී

සචිත් අකලංක නොහොත් කොස් මල්ලී දෙහිවල, ගල්කිස්ස සහ බඩෝවිට ප්‍රදේශ කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක වන ප්‍රධාන පෙළේ සංවිධානාත්මක අපරාධකරුවකු සහ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකි. ඔහු බඩෝවිට අසංකගේ ප්‍රධානතම ප්‍රතිවිරුද්ධ පාතාල නායකයා ලෙස හඳුන්වනු ලබයි.

බඩෝවිට සහ ගල්කිස්ස ප්‍රදේශවල මත්ද්‍රව්‍ය ජාලයේ ආධිපත්‍යය පැතිරවීම සඳහා කොස් මල්ලි සහ බඩෝවිට අසංක අතර වසර ගණනාවක සිට ඇත්තේ දරුණු ගැටුමකි. කොස් මල්ලී ඩුබායිහි රැඳීසිටින අතර ඔහු ඩුබායි පනින්නේ දුමිත් නලින් නැමැති පුද්ගලයෙක් ලෙස ව්‍යාජ විදෙස් ගමන් බලපත්‍රයකිනි. තවදුරටත් ඔහු ඩුබායිහි රැඳී සිටියි.

### 31. කැවුමා

කැලුම් ඉන්දික නොහොත් කැවුමා ගැන රටම දැන ගන්නේ 2019 වසරේ මාර්තු 05 වැනිදා කිරිබත්ගොඩදී පැලියගොඩ පොලිසිය විසින් අත්අඩංගුවට ගැනීමත් සමගිනි. මාකඳුරේ මධුෂ්ගේ ගෝලයෙක් වන ඔහු පන්නිපිටියේ සිදුවූ රුපියල් ලක්ෂ 500 දියමන්ති මංකොල්ලයට සම්බන්ධ වූවෙකි. ඔහු අවි සහ මත්කුඩු සැඟවීමට යොදාගත්තේ මොරටුව සොයිසාපුර නිවසකි. එහි තිබී හෙරොයින් කිලෝ 177ක් සමග ආයුධ රැසක්ද පොලිස් විශේෂ කාර්ය බළකාය එකල සොයාගත්තේය. බූස්ස බන්ධනාගාරයේ කාලයක් රඳවා සිටි ඔහු 2020 වසරේ රටින් පලාගොස් තිබුණි. ඔහු රැඳී සිටින්නේ කුමන රටකදැයි නිශ්චිතවම තවමත් අනාවරණ වන්නේ නැත.

### 32. කරන්දෙණිය සුද්දා



සෝබන හන්දි ජයලත් ද සිල්වා නොහොත් කරන්දෙණිය සුද්දා හමුදාවේ කමාන්ඩෝ බළකායේ සිටි සෙබළෙකි. කුලී ඝාතකයෙක් වන ඔහු කුප්‍රකට චරිතයක් වන්නේ සිය සහෝදරයා වූ රාජු සමග එක්ව කරන්දෙණිය රෝහලේ සේවය කළ 'හිත හොඳ දොස්තර' ලෙස ප්‍රසිද්ධව සිටි වෛද්‍ය ප්‍රියන්ත ජයසිංහ මහතා 2011 සැප්තැම්බර් 29 වැනිදා ඝාතනය කිරීමත් සමගිනි. මුළු රටම කැලඹූ එම ඝාතනය ඔවුන් දෙදෙනා විසින් කරනු ලැබුවේ හමුදා සේවයේ සිටින අතරතුරදීය. එම ඝාතනය සම්බන්ධයෙන් කාලයක් බන්ධනාගාරගතව සිටි ඔහු ඇප ලැබීමෙන් පසුවද වසරකට වැඩි කාලයක් බන්ධනාගාරගතව සිටියේ ආරක්ෂක අංශ විසින් ඔහුව ඝාතනය කරනු ඇතැයි සැක කරමිනි. පසුව ඔහු කාටත් හොරා ඇප ලබා ඩුබායි පනින්නේ ව්‍යාජ විදෙස් ගමන් බලපත්‍රයකිනි. එරට සිට ඔහු මෙම වසරේ පෙබරවාරියේදී අකුරේගොඩදී නීතිඥ බුද්ධික මල්ලවාරච්චි සහ ඔහුගේ බිරිඳ ඝාතනය කරවනු ලැබීය. පොලිස් පරීක්ෂක බලේන්ද්‍රසිංහ, විශ්‍රාමික බන්ධනාගාර අධිකාරිවරයෙක්, බන්ධනාගාර ජේලර්වරයෙක්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙක්ද ඝාතනය කරවීය. පොලිස් විශේෂ කාර්ය බළකායේ නිලධාරීන් කිහිප දෙනෙක්ද ඔහුගේ ඉලක්කය වී ඇති බව බුද්ධි අංශ සඳහන් කරයි.

### 33. රත්ගම විදුර

පුබුදුමුනි විදුර ලක්ෂාන් ද සොයිසා විජේසිංහ නොහොත් රත්ගම විදුර දකුණු පළාත කේන්ද්‍ර කරගනිමින් මත්ද්‍රව්‍ය ජාවාරම් සහ සංවිධානාත්මක අපරාධ මෙහෙයවන ප්‍රබල පාතාල කල්ලි නායකයෙකි.

නාවික හමුදාවේ සිටි සෙබළෙක් වන ඔහු ප්‍රබල මත්කුඩු ජාවාරම්කරුවෙක් ලෙස කුප්‍රකටය. කළු සල්ලි ඔහු සුදුකළ බව කියනු ලබන්නේ දකුණේ දේශපාලනඥයන් සහ ව්‍යාපාරිකයන් මගිනි. දකුණේ එජාපයේ ප්‍රබල දේශපාලනඥයකු සහ විදුර අතර ඇති සම්බන්ධකම් ගැන බුද්ධි අංශ වාර්තා පවා ඇත. එකී දේශපාලනඥයා නියෝජනය කළ පක්ෂයට බලය ආ සෑම අවස්ථාවකදීම පාහේ දකුණේ පොලිස් පුටුවලට නිලධාරීන් පත්කරන විට විදුරද තමන්ට කැමැත්තක් ඇති අය පත්කරගෙන තිබුණි. ඒ එම දේශපාලනඥයා සහ විදුර අතර ඇත්තේ ගහට පොත්ත මෙන් වූ සම්බන්ධයක් වන බැවිනි.

2006 වසරේදී ව්‍යාජ ගුවන් ගමන් බලපත්‍රයකින් මෙරටින් පලාගිය ඔහු, දැනට ඉතාලියේ රැඳීසිටින බව සඳහන්ය.

### 34. ප්‍රංශ රූබන්

අලගෝරම් ජෝති රූබන් නොහොත් ප්‍රංශ රූබන් හිටපු එල්.ටී.ටී.ඊ. සාමාජිකයෙකි.

2009 වසරේදී මෙරට සිවිල් යුද්ධය අවසන් වූ කාලවකවානුවේදී ඔහු රටින් පැන්නේය. ඔහුගේ උපන් ගම යාපනයයි. මත්කුඩු ජාලය සහ පාතාල කටයුතු සිදුවන්නේ කොළඹ මෝදර සහ මට්ටක්කුලිය ආශ්‍රිතවය. ලංකාවට අයිස් ගේන්න මුල්වූ මහා පරිමාණ මත්කුඩු ජාවාරම්කරු ලෙස හඳුනාගෙන සිටින ඔහු ප්‍රංශයේ ජීවත්වන බව සඳහන්ය.

### 35. ගොත අසංක

ලියනගේ අසංක සිරිනාත් නොහොත් ගොත අසංක අංගොඩ, නවගමුව ආශ්‍රිතව ක්‍රියාත්මක වූ පාතාල



අපරාධකරුවෙකි. අංගොඩ ලොක්කාගෙන් පසු ඒ තැනට පත්වූයේ ඔහුය. එල්.ටී.ටී.ඊ.යේ වෙඩික්කරුවන්ගෙන් පවා වැඩගත් ඔහු 2023 වසරේදී රටින් පැන්නේය.

ඉන්දියාවේ රැඳීසිටියදී බැංගලෝර්වලදී ඔහුව ඉන්දීය මධ්‍යම අපරාධ විමර්ශන අංශය විසින් අත්අඩංගුවටද ගත්තේය. අනතුරුව ඔහු ඩුබායි පැනගත් බව සඳහන් විය.

### 36. මෝදර නිපුන

මෑතකදී මෝදර ආශ්‍රිතව සිදුවූ වෙඩිතැබීම් සහ ඝාතන රැසකට නම නියැවුණු චරිතයකි. ඔහු දැනට ඩුබායිහි රැඳී සිටියි.

### 37. අප්පුගේ පුතා චමිල

'කෝපි කඩේ' ටෙලිනාට්‍ය මාලාවේ අප්පුගේ චරිතයට පණ පෙවූ ශ්‍රී ලාල් අබේකෝන් කලාකරුවාගේ පුත්‍රයා වන චමිල අබේකෝන් මත්කුඩු ජාවාරම සිදුකරන මහා පරිමාණයේ ජාවාරම්කරුවෙකි.

ඩුබායි රැඳී සිටිමින් ඔහුගේ අනුදැනුම මත මෙරට වෙඩිතැබීම් කිහිපයක්ද මෙහෙයවා ඇත.

### 38. දිප්පිටිගොඩ ලහිරු

දිප්පිටිගොඩ ආරච්චිලාගේ ලහිරු අනුෂාන් නොහොත් දිප්පිටිගොඩ ලහිරු මත්කුඩු ජාවාරමට සම්බන්ධ ප්‍රබල පාතාල අපරාධකරුවෙකි. ඔහු ජපානයේ මේ වනවිට රැඳීසිටින බවට තොරතුරු ඇත.

### 39. හීනටියන මහේෂ්

නුරේෂ් සුපුන් දයාරත්න නොහොත් හීනටියන මහේෂ් දැනට ඩුබායි රාජ්‍යයේ සැඟව සිටිමින් මිනුවන්ගොඩ, මීගමුව සහ දංකොටුව යන ප්‍රදේශවල ව්‍යාපාරිකයන් බියගන්වා කප්පම් ගැනීම්වල නිරතව සිටියි. ඔහුගේ ගෝලයින් කිහිප දෙනෙක්ම පොලිස් වෙඩි ප්‍රහාරයට ලක්ව ඇත. ඔහු ඩුබායි පනින්නේ ව්‍යාජ ලෙස සකස් කළ විදෙස් ගමන් බලපත්‍රයකිනි. එම විදෙස් ගමන් බලපත්‍රය සකස්කළ නියෝජ්‍ය ආගමන විගමන පාලකවරායද 2024 වසරේ අත්අඩංගුවට පත්විය.

### 40. උනාකුරුවේ ශාන්ත

ශාන්ත කුමාර නොහොත් උනාකුරුවේ ශාන්ත දකුණේ උනාකුරුව ගම්මානයේ වැසියෙකි. ආරම්භක ජවිපෙ සාමාජිකයෙක් වන ඔහු පසුව රාජපක්ෂවරුන්ට සම්බන්ධව සිටියෙකි. මහා පරිමාණයේ මත්කුඩු ජාවාරමට සම්බන්ධව සිටින ඔහු ඩුබායි සිට බෙලරුස් රාජ්‍යයට සංක්‍රමණ වී එහි සිට මත්කුඩු ජාවාරම මෙහෙයවන බව සඳහන්ය.

### 41. දෙහිබාලෙ මල්ලි



පටබැඳි මද්දුමාගේ ශෙහාන් සත්සර නොහොත් දෙහිබාලේ මල්ලි කිලෝ සිය ගණනින් මත්කුඩු බෝට්ටු මගින් මෙරටට ගෙන්වූ අයෙකි. පොලිසියේ ඉහළ නිලධාරීන් සමග ඉතා කිට්ටු සම්බන්ධකම්ද ඔහුට ඇත. දෙවිනුවර ශ්‍රී විෂ්ණු දේවාලයේ වාහල්කඩ ඉදිරිපිටදී 2025 මාර්තු 21 වැනිදා ඔහු තරුණයන් දෙදෙනෙක් වෙඩිතබා මරාදැමුවේය. දෙහිබාලේ නැමැති මත්ද්‍රව්‍ය ජාවාරම්කරු ගැන රටම දැන ගන්නේ ඒත් සමගිනි. එකල පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ ලොක්කෙක්ද දෙහිබාලේගේ නිවසට නිතර යන එන අයෙක් බව හෙළිවන්නේත් දෙහිබාලේ මල්ලි මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ ලේඛනයේ පවා නැති බවත් අනාවරණ වන්නේ ඒත් සමගිනි. ඔහු ඩුබායිහි රැඳීසිටින බව සඳහන්ය. එහෙත් ඔහු යුරෝපීය රටකට පැන ඇති බවටද තොරතුරු ඇත.

### 42. චූවා සමන්ත



අධිකාරිගේ සමන්ත පෙරේරා නොහොත් චූවා සමන්ත දෙහිවල සහ බඩෝවිට ආශ්‍රිතව මත්කුඩු ජාවාරමේ නිරත කල්ලි නායකයෙකි. ඔහු ඩුබායි රැඳී සිටිමින් අපරාධවල සහ මත්කුඩු ජාවාරමේ නිරතව සිටියි.

### 43. ගිහාන් ෆොන්සේකා

සූරසිංහ ආරච්චිගේ ගිහාන් ෆොන්සේකා මේ වන විට රැඳීසිටින්නේ ඩුබායි රාජ්‍යයේය. ඔහු යුරෝපයට පැනයාමේ සූදානමක්ද ඇත. මාකඳුරේ මධුෂ්ගේ පාතාල ගුරුන්නාන්සේ යැයි කියැවෙන්නේ මොහුය. 2020 පෙර ඔහු රටින් පැනගිය අතර රටින් පනින්නට පෙර මීගමුව බන්ධනාගාරයේ කාලයක්ම රිමාන්ඩ් සිරකරුවෙක් ලෙස සිටියේය. ඔහුට බන්ධනාගාරයේ වෙනම කුටියක් තිබූ අතර එම කුටියේ කුඩා ශීතකරණයක්, සැප පහසු මෙට්ටයක්, රූපවාහිනී ඇතුළු පහසුකම් රැසක්ම පැවතුණි.

### 43. ජිලේ

ඉෂාන් ජිලේ නොහොත් ජිලේ අංගොඩ දෙල්ගහවත්තේ පදිංචිකරුවෙකි. අංගොඩ ලොක්කාගේ සමීපතයෙක් ලෙස පාතාලයට බැස්ස ඔහු ලොක්කාගේ මරණින් පසු තනිවම කල්ලියක් නඩත්තු කළේය. 2022 අගෝස්තු 02දා කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු මන්ත්‍රී සුමුදු රුක්ෂාන් ඝාතනය කරවන්නේ ඔහුය. ඩුබායි වෙත ඔහු පලා යන්නේද එකලය.

### 44. පලනි ශිරාන් 45. පලනි කෙනිස්ටන් 46. පලනි රිමෝෂන්

මෝදර මට්ටක්කුලිය ආශ්‍රිතව මත්කුඩු ජාවාරමේ අණසක පතුරුවාගෙන සිටි කාන්තාවක් වූ කුඩු සෙල්විගේ වැඩිමහල් පුතා වන්නේ පලනි ශිරාන් ක්ලෝරියන් නොහොත් පලනි ශිරාන්ය. පූකුඩිකන්නාගේ සැලසුමකට අනුව බුම්මා විසින් කුඩු සෙල්වි සහ ඇගේ සැමියා ඝාතනය කිරීමෙන් අනතුරුව පලනි ශිරාන් පාතාලයට වැටෙන්නේ කංජිපානි ඉම්රාන්ගේ අඩිපාරේ යමිනි. සිය සහෝදරයන් දෙදෙනා වන පලනි කෙනිස්ටන් සහ පලනි රිමෝෂන් සමග එක්ව මත්කුඩු ජාවාරමට සම්බන්ධ වෙමින් මව සහ පියා මැරූ ඝාතකයන්ගෙන් පළිගැනීම ආරම්භ කරන ඔවුන් පසුව ඉන්දියාවට පනින්නේ ජීවිතාරක්ෂාව පතාය. මේ වනවිට ඔවුන් තිදෙනාම සිටින්නේ ඉන්දියානු ආරක්ෂක අත්අඩංගුවේය. මෙම පිරිස හැරුණු කොට දෙමටගොඩ චමින්දගේ පුතා, සයිමා, තම්මිට අවිස්ක, දෙහිවල සැන්ඩෝ, රන් මල්ලී, පැලියගොඩ ශක්ති, කැන්ගර් අප්පු, සුරංජිත් සිල්වා, ගල්කිස්ස ධනුෂ්ක, පොඩි පැටී, වනාතේ චතු ඇතුළු තවත් පාතාලයේ අපරාධකරුවන් පිරිසක් එක්සත් එමීර් රාජ්‍යයේත් ජපානයේත්, රුසියාවේත් රැඳී සිටිති.

*රුවන් වෙඩිවර්ධන*